# මානව හිමිකම් සුරකින්නන් සඳහා අත්පොත



**මානව හිමිකම් සුරකින්නන් සමග කරන ලද සාකච්ඡාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස සකස් කරන ලද්දකි.**

## මානව හිමිකම් සුරකින්නන් සදහා අත්පොත පිළිබද හැදින්වීමක්

මානව හිමිකම් සුරකින්නන් සඳහා අත්පොත නිර්මාණය වූයේ ක්‍රිසලිස් සංවිධානය, නීතිය හා සමාජ භාරයේ හවුල්කාරීත්වය සහිතව ක්‍රියාත්මක කරනු ලබන BRIDGE ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් වශයෙනි. BRIDGE ව්‍යාපෘතිය මානව නිදහස සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින්  ප්‍රජාවන් එකිනෙකට සම්බන්ධ කිරීම සදහා වූ ව්‍යාපෘතියක් වන අතර උතුරු පළාත ආවරණය කරමින් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහම ආවරණය කරමින් මානව හිමිකම් ආරක්ෂා කරන්නන් මෙන්ම යාපනය විශ්වවිද්‍යාලයේ නීතීවේදී සිසුන් සමග විවිධ අවස්ථාවන්හි දී සාකච්ජා සිදු කරන ලදී. එම සාකච්ජා වලදී දැනට ඔවුන් විසින් ඔවුන්ගේ ප්‍රජාවන්ට සහය දක්වන අයිතිවාසිකම් ක්ෂේත්‍ර සහ ඊට අදාලව සේවාවන් ලබා ගන්නා සේවා ප්‍රවේශයන් පැහැදිලි කරන ලදී. ඔවුන් දැනට සම්බන්ධව සිටින සේවා ප්‍රවේශයන් සිතියම් ගතකරමින් සිදු කරන ලද සාකච්ජා වලදී මෙම අත්පොතෙහි ආවරණය වන ක්ෂේත්‍ර සම්බන්ධව ඔවුන්ගේ දැනුමෙහි පවතින හිඩැස් හදුනා ගන්නා ලදී. තවද එම සාකච්ජා වලදී මෙකී ක්ෂේත්‍ර සම්බන්ධව දැනුම ඇතුලත් ඔවුන්ට පහසුවෙන් පරිශීලනය කල හැකි අත්පොතක් සකස් කරදෙන ලෙස ඉල්ලීම් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ මානව හිමිකම් සුරකින්නන් සඳහා වූ අත්පොත තුල මානව හිමිකම් සුරකින්නන් විසින් එදිනෙදා භාවිතයට ගන්නා ක්ෂේත්‍රයන්ට අදාල නීතී රෙගුලාසි, එහි ප්‍රායෝගික භාවිතයන් සහ ඊට අදාලව සේවා ලබාගන්නා සේවා ස්ථාන සම්බන්ධ තොරතුරු ඇතුලත් වේ.

මෙම ප්‍රකාශනය සඳහා අරමුදල් සපයන ලද්දේ යුරෝපා සංගමය විසිනි. එහි අන්තර්ගතය ක්‍රිසලිස් සහ නීතිය සහ සමාජ භාරයේ තනි වගකීමක් වන අතර, එය යුරෝපා සංගමයේ අදහස් පිළිබිඹු කිරීමක් නොවිය හැක.

Funded by the European Union

Implemented by :

Chrysalis Catalyzing change

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# පටුන


| | | |
|---|---|---|
| 01 | පරිසරය සහ නීතිය | 4 |
| 02 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය (GRC) ලබාගැනීමේ මාර්ගෝපදේශය | 12 |
| 03 | තොරතුරු දැනගැනීමේ අයිතිය | 20 |
| 04 | මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් | 28 |
| 05 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ නීතිය | 32 |
| 06 | රජයේ ඉඩම් හා බැදුණු ඔබේ අයිතිවාසිකම් - පුරවැසි මාර්ගෝපදේශන් | 40 |

# පරිසරය සහ නීතිය



කසුන්, අද පත්තරේ දැක්කද? පරිසර දූෂණයට එරෙහිව පරිසරයේ ආරක්ෂාවට තවත් නීති දැඩි කරනවා කියලා.

ඔව්. ඒක හොඳ දෙයක්. අපේ රටේ වනාන්තර, ස්වභාවික සම්පත් ආරක්ෂා කරන්න නීති තදින් ක්‍රියාත්මක වෙන්න ඕනේ. අමල් දන්නවද ලංකාවේ මේ සම්බන්ධයෙන් දැනට පවතින නීති මොනවද කියලා.

ඔව්. මම ඒවායින් කිහිපයක් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබද උදාහරණත් එක්ක පහතින් දක්වන්නම්.



« පටුන වෙත

ශ්‍රී ලංකාවේ උත්තරීතරම නීතිය හා සියලු නීතිවල පදනම ලෙසින් සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම දැක්වෙන 27 (14) ව්‍යවස්ථාවේ මෙසේ දැක්වේ.

> "ජනතාවගේ යහපත කතා රජය විසින් පරිසරය සුරක්ෂිතකොට වැඩිදියුණු කළ යුත්තේය".

එමෙන්ම 28 (ඊ) ව්‍යවස්ථාව මෙසේ පවසයි.

> "ස්වභාවධර්මය හා ස්වාභාවික සම්පත් රැක ගැනීම ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තකුගේම මූලික යුතුකමකි".

ඒ අනුව ස්වභාවික සම්පත් හා පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම රජයට මෙන්ම පුරවැසියන් ලෙස අප සෑම කෙනෙකුම වෙත පැවරී ඇති වගකීමකි.

රජය සතු මෙම වගකීම ක්‍රියාත්මක කිරීම සදහාත්, මහජනතාව ලෙස අප සෑම කෙනෙකු එම වගකීමට  බැඳීම ක්‍රියාත්මක කරවීම සදහාත් සම්පාදනය කෙරුනු නීති රැසක් මෙරට තුල ක්‍රියාත්මකව පවතී. ඒ යටතේ බලාත්මක කොට ඇති පරිසර වැරදි විශාල සංඛ්‍යාවක් සහ පරිසරය ආරක්ෂා කරගැනීම සදහා වන ක්‍රියාමාර්ග හා පිලිවිතර රැසක් මෙන්ම ඒ සදහා වන වගකීම් ක්‍රියාත්මක කිරීම සදහා වන ආයතන රැසක්ද පවතී. එයින් කිහිපයක් පහත සාකච්ඡා කරනු ලැබේ.

කර්මාන්තශාලා වලින් පරිසරයට කුණු බැහැර කරන එක දැන් ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා. අමල් දන්නවද ඒ සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය?

ඔව්. ඒ සම්බන්ධ නීතිමය තත්ත්වය මේ ආකාරයෙනුයි ක්‍රියාත්මක වෙන්නේ.



## කර්මාන්ත සඳහා ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍ර

කිසියම් කර්මාන්තයක ක්‍රියාකාරීත්වය නිසා ප්‍රතිඵල කෙරෙන අපද්‍රව්‍ය පරිසරයට බැහැර කරන්නේ නම් මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතුවේ (1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 23 (අ)).

මෙහිදී අපද්‍රව්‍ය යනු - ඝන අපද්‍රව්‍ය, අප ජලය, වායු විමෝචක, ශබ්දය යනාදී සියල්ල ඇතුලත්ය. එම අපද්‍රව්‍ය පරිසරයට හානිදායක නොවන ආකාරයෙන් බැහැර කිරීමට ගන්නා ක්‍රියාමාර්ග ඉදිරිපත් කරමින් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුවේ. අනතුරුව ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු මධ්‍යම පරිසර අධිකාරය විසින් පනවනු ලබන කොන්දේසි හා නිර්දේශවලට යටත්ව නිශ්චිත කාළයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබයි. කර්මාන්තය කරගෙන යා යුත්තේ එකී කොන්දේසි හා නිර්දේශවලට අනුකූලවය (1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 23 (ආ)).

බලපත්‍රයේ සඳහන් කාළය අවසානයෙන් පසුව තවදුරටත් අදාල කර්මාන්තය පවත්වාගෙන යන්නේ නම් හෝ බලපත්‍රය ලබාගත් අවස්ථාවේ නොතිබූ වෙනසක් හෝ ව්‍යාප්ත කිරීමක් සිදුකරන්නේ නම් පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කරගත යුතුය. එසේ නොකොට කර්මාන්තය පවත්වාගෙන යන්නේ නම් හෝ බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩ කරන්නේ නම් බලපත්‍රය අහෝසි කිරීම හෝ අත්හිටුවීම සිදුකළ හැකිය (1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 23 (ඈ)).



## වනාන්තර සම්බන්ධයෙන් බලපවත්වන නීති

**වන සංරක්ෂණ ආඥා පනතට අනුව ශ්‍රී ලංකාවේ වනාන්තර වර්ග**



### සංරක්ෂිත වනාන්තර

1995 අංක 23 දරන පනතින් සංශෝධිත වන සංරක්ෂණ ආඥා පනතේ 3 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද සුවිශේෂී පරිසර පද්ධති, ජෛව විවිධත්වයෙන් ඉහළ හා දුර්ලභ ශාක හා සත්ව විශේෂ ජීවත්වන වනාන්තර



### රක්ෂිත වනාන්තර

1995 අංක 23 දරන පනතින් සංශෝධිත වන සංරක්ෂණ ආඥා පනතේ 3 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද වනාන්තර



### ග්‍රාමීය වනාන්තර

ග්‍රාමීය ජනතාවගේ වනාන්තර අවශ්‍යතා තෘප්ත කිරීම පිණිස වන සංරක්ෂණ ආඥා පනතේ 12 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද වනාන්තර



### වෙනත් රජයේ කැලෑ

ඉහත කාණ්ඩ 3 ට අයත් නොවන රජයේ ඉඩම්වල පවතින කැලෑ

**එක් එක් වනාන්තර තුල වැරදි ලෙස සැලකෙන ක්‍රියා සහ ඊට නියමකොට ඇති දඬුවම්**

| වනාන්තර වර්ගය | වැරදි | දඬුවම් |
|---|---|---|
| සංරක්ෂිත වනාන්තර (1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 6 (2) (1) වගන්තිය) | බලපත්‍රයක් නොමැතිව -<br>• විද්‍යාත්මක පර්යේෂණවල නිරතවීම, ශාක හා සතුන් නිරීක්ෂණය, අයුතු ඇතුලු වීම හා රැඳී සිටීම, ගස් කැපීම, ගස්වල පොතු ගැලවීම. අතු කැපීම, කැළය එලි කිරීම හෝ ශාක කොටස්වලට හානි කිරීම, ළඟ තබාගැනීම, ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම<br>• ගවයින් ඇතුලු කිරීම, තණකොළ කැපීම හෝ එකී තණකොල ගවයින්ට ලබාදීම<br>• වනාන්තරයේ දිය පහර අවහිර කිරීම<br>• පතල් කැපීම හෝ ඛනිජ ඉවත් කිරීම<br>• දඩයම් කිරීම හෝ ඊට උගුල් ඇටවීම<br>• වෙඩි තැබීම හෝ සතුන්ගේ ප්‍රජනන ස්ථානවලට හානිවන කිසියම් ක්‍රියාවක් සිදු කිරීම<br>• සතුන් විකිණීම හෝ විකිණීමට ළඟ තබාගැනීම<br>• ශාක හෝ සතුන්ට හානිවිය හැකි ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ ළඟ තබාගැනීම | • අවු. 7 ට නොවැඩි සිර දඬුවමක් හෝ රු.20,000/= - රු.200,000/= අතර දඩයක් හෝ ඒ දෙකම සහ<br>• ඊට අමතරව සිදුකළ හානියට වන්දියක් ගෙවීමට නියම කිරීම |

| වනාන්තර වර්ගය | වැරදි | දඬුවම් |
| --- | --- | --- |
| | • සතෙකුගේ බිත්තර හෝ කූඩු විනාශ කිරීම හෝ ළඟ තබා ගැනීම, ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිලි ඉදි කිරීම හෝ පදිංචිවීම, ගොවිතැන හෝ වෙනත් කවර හෝ කටයුත්තකට පාංශු ස්ථරයට හානි කිරීම, වලවල් කැපීම හෝ එලි පෙහෙලි කිරීම<br>• ගිනි තැබීම හෝ ගින්නක් පැතිර යාමට ඉඩහැරීම<br>• ඛනිජ ඉවත් කිරීම<br>• මායිම් ලකුණු කිරීමට ඉදිකර ඇති තාප්පයක්, අගලක්, වැටක්, නාම පුවරුවක්, සංඥා පුවරුවක් හෝ මායිම් ලකුණකට හානි කිරීම, ඉවත් කිරීම හෝ වෙනසක් කිරීම | |
| රක්ෂිත වනාන්තර (1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 7 (1) වගන්තිය) | • අයුතු ඇතුලු වීම හා රැඳී සිටීම<br>• ගවයින් ඇතුලු කිරීම, තණකොළ කැපීම හෝ එකී තණකොල ගවයින්ට ලබාදීම<br>• ගස් කැපීම, අතු කැපීම, කැළය එලි කිරීම, චුවමනාවෙන්ම හෝ නොසැලකිල්ල නිසා ගස්වල පොතු ගැලවීම හෝ ශාක කොටස්වලට හානි කිරීම<br>• වනාන්තරයේ දිය පහර අවහිර කිරීම<br>• ශාකයක් හෝ ශාක කොටසක් ගැලවීම, විනාශ කිරීම, හානි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම<br>• සතුන් මැරීම, මැරීමට තැත් කිරීම, ඇල්ලීම, ඇල්ලීමට තැත් කිරීම, ප්‍රවාහනය, වෙඩි තැබීම, උගුල් ඇටවීම හෝ එම සතුන්ගේ වාසස්ථානවලට හානි කිරීම, කලු ගල් කැඩීම, හුණුගල් හෝ ගල් අගුරු ගිනි තැබීම, ඛනිජ වර්ග, මැණික්, වැලි, පස් කැනීම, ප්‍රවාහනය, ළඟ තබා ගැනීම, ගිනි තැබීම හෝ ගිනි තැබීමට යොදාගත හැකි ද්‍රව්‍ය ළඟ තබාගැනීම හෝ ගින්නක් පැතිරයාම වැලැක්වීමට කටයුතු නොකිරීම<br>• ගස් කැපීම, ඉරීම, දැව ප්‍රවාහනය<br>• දැව ඉරීමට පලංචි ඉදි කිරීම හෝ ඉරුම් වලවල් කැනීම, ගොවිතැන හෝ වෙනත් කවර හෝ කටයුත්තකට පාංශු ස්ථරයට හානි කිරීම, වලවල් කැපීම හෝ එලි පෙහෙලි කිරීම, මාර්ග ඉදිකිරීම හෝ එවැනි මාර්ගයක් භාවිතා කිරීම | • අවු. 5 ට නොවැඩි සිර දඬුවමක් හෝ රු.10,000/= - රු.100,000/= අතර දඩයක් හෝ ඒ දෙකම සහ<br>• ඊට අමතරව සිදුකළ හානියට වන්දියක් ගෙවීමට නියම කිරීම |
| ග්‍රාමීය වනාන්තර (1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 12 වගන්තිය) | • ජලයට වස එක් කිරීම, ගිනි හෝ වෙනත් ක්‍රම මගින් මීඇකේෂියා, ඇලු, බෙලි, බුලු, බුරුත, දෙල්, බැදිදෙල්, දිවිකදුරු, දිවුල්, දොඹ, දුන්, එලකෙඩාල්, ඇත්දෙමට, ඉයුකැලිප්ටස්, ගම්මාලු, ග්ලිරිසීඩියා, හල්මිල්ල, හුලන්හික්, ඉපිල් ඉපිල්, කෙඩොල්, කිරල, කොහොඹ, කොස්, කුඹුක්, ලුණුමිදෙල්ල, ඉල්කෙඩාල්, මල්මාර, මෙන්ඩෝරා, මී, මිල්ල, මිදැල්ල, නා, නැදුන්, නෙල්ලි, පලු , පිහිඹියා, පයිනස්, පිනිමාර, පුන්කරද, | මාස 1-12 අතර සිර දඬුවමක් හෝ රු.1,000/= - රු. 5,000/= අතර දඩයක් හෝ ඒ දෙකම |

| වනාන්තර වර්ගය | වැරදි | දඬුවම් |
|---|---|---|
| | රුක්අත්තන, සපු, ගිනිසපු, සියඹලා, සූරියමාර, තේක්ක, වල්ඇහැල, වල්සපු, වැවරණ යන ශාක කැපීම හෝ එකී ශාකවලට හානි කිරීම සහ එකී දැව ඉරීම<br>• අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගවලට පටහැනිව ගව පාලනයේ යෙදීම | |
| වෙනත් රජයේ කැලෑ (ඉහත කාණ්ඩ 03 ට අයත් නොවන සියලු රජය සතු කැලෑ ඉඩම්) (1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 20 වගන්තිය) | • ඇමතිවරයා විසින් නිශ්චිත කැලෑවකට අදාලව සිදුකරනු ලබන නියෝග යටතේ මිස අන් අකාරයකින් කැලෑ ගිනි තැබීම, පසට හානි කිරීම හෝ ගව පාලනයේ යෙදීම<br><br>පහත කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නියෝග නිකුත් කළ හැකිය.<br><br>• කිසියම් නිශ්චිත කැලෑවකට අදාලව බුරුත, දෙල්, බැදිදෙල්, දුන්, දුම්මල දුන්, ගම්මාලු, හල්, හල්මිල්ල, හොර, හුලංහික්, කුඩුම්බේරිය, කලු වර, කීන, කොහොඹ, කොස්, ලුණුමිදෙල්ල, මැහෝගනී, මිල්ල, නා, නැදුන්, පලු, පිහිඹිය, සපු, සූරියමාර, සියඹලා, සුදුහඳුන්, තල්, තෙවැන්න, තේක්ක, උඹිබේරිය, වල්සපු, වල්නික, වන මී, වෑවරණ යන ශාක කැපීම තහනම් කිරීම, වැවෙන කැලෑවක ගස් කැපීම තහනම් කිරීම හෝ ඒ සදහා බලපත්‍ර ලබාදීම | • අවු. 2 කට අඩු සිර දඬුවමක් හෝ රු. 50,000/= ක ට වඩා අඩු දඩයක් හෝ ඒ දෙකම සහ<br><br>• ඊට අමතරව සිදුකළ හානියට වන්දියක් ගෙවීමට නියම කිරීම |




**බලපත්‍ර රහිතව ප්‍රවාහනය කළහැකි දැව වර්ග (2008-05-09 දිනැති 1548/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය)**

පොල්, පුවක්, රබර්, කජු, වගාකළ කුරුඳු, කොට්ටම්බා, ගන්සූරිය, පුලුන්, වගාකළ අඹ, කිතුල්, ඇල්බීසියා, ඇඹරැල්ල, ග්ලිරිසීඩියා, කටු ඉඹුල්, හවරිනුග, ලුණුමිදෙල්ල, සබුක්කු, රඹුටන්, ඉපිල් ඉපිල්, කැන්ද, වනසපු, ගොඩකදුරු, එරබදු, රුක්අත්තන, අලිගැටපේර, තුනී ලෑලි නිෂ්පාදන, වේවැල් භාණ්ඩ, ආනයනික ඉරූ දැව

## විශේෂ තත්ත්වයන් යටතේ ප්‍රවාහනයට අවසර ලබා දී ඇති දැව සහ ප්‍රදේශ

| දැව වර්ගය | බලපත්‍ර නොමැතිව ප්‍රවාහනය කළහැකි ප්‍රදේශ |
|---|---|
| මැහෝගනී/ බුරුත/ තේක්ක/ කොහොඹ | කොළඹ දිස්ත්‍රික්කය |
| ඉයුකැලිප්ටස් වර්ග | කොළඹ/ගම්පහ/කලුතර/මාතලේ/ගාල්ල/මන්නාරම/වවුනියාව/මුලතිව්/කිලිනොච්චිය/කුරුණෑගල/රත්නපුර/කෑගල්ල දිස්ත්‍රික්ක |
| ටූනා | මහනුවර/ නුවරඑළිය/ බදුල්ල/ රත්නපුර හැර සියලු දිස්ත්‍රික්ක |
| ගිනිසපු | මහනුවර දිස්ත්‍රික්කය |
| කලුවර/ කලුමැදිරිය/ සුදුහඳුන් සහ අනෙකුත් සියලුම වර්ගවල ඉරන ලද දැව, වට කණු හා දර | දිවයින තුල පිහිටි සියලු මහනගර සභා ප්‍රදේශ, හංවැල්ල හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැර කොළඹ දිස්ත්‍රික්කය |

**ඉහත දක්වා ඇති බලපත්‍ර නොමැතිව ප්‍රවාහනය කළහැකි අවස්ථාවලදී, ඉහත සදහන් දැව වර්ග හැර අනෙක් සියලු දැව වර්ග ප්‍රවාහනය සදහා බලපත්‍රයක් අනිවාර්ය වේ. බලපත්‍ර නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් (ග්‍රාම නිලධාරි සහ අඩවි වන නිලධාරීන්ගේ නිර්දේශ මත) සිදු කරනු ලබන අතර ඉල්ලුම්කරුගේ ඉඩමේ අයිතිය සනාථ කිරීම, ප්‍රවාහනයට යොදාගන්නා රථයේ ලියාපදිංචි අංකය සහ ප්‍රවාහනය කරන මාර්ගය නිශ්චිතව සදහන් කිරීම අවශ්‍ය වේ. බලපත්‍රයේ සදහන් වන දිනයේ අදාල කාලසීමාව තුල ප්‍රවාහනය සිදුකළ යුතුය.**

කසුන් දන්නවද ලංකාවේ සමහර සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන්න කලින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සහ පූර්වයෙන් ලබා ගත යුතු ඇගයීම් වාර්තා තියෙනව කියල?

ඔව් මම අහලා තියෙනවා. සමහරු කියනවා ඒ වාර්තා ගන්න එකෙන් සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාද වෙනවා කියලා. ඒත් ප්‍රමාදයට වඩා දිගු කාලීනව බලද්දි රටටත් ජනතාවටත් ඒක ප්‍රගතිගාමී පියවරක් වෙනවා. අමල්ට පුලුවන්ද ඒ ක්‍රියාවලිය ගැන මට පැහැදිලි කරන්න?

ඔව්. මං ඒ ගැන මේ විදිහට පැහැදිලි කරන්නම්.



## පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා
## (ජාතික පාරිසරික පනතේ අංක 23 (අ) වගන්තිය)

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ පාරිසරිකව සංවේදී ප්‍රදේශවල ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා ලබාගත යුතු වේ. (1993-06-24 දිනැති 772/22 දරන ගැසට් පත්‍රය)

පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා අවශ්‍ය වන ව්‍යාපෘති (2008-01-25 දිනැති අංක 1533/16 ගැසට් පත්‍රය)

- මුහුදු වෙරළේ සිට මීටර් 300 ක් ගොඩබිම ඇතුලත හෝ මුහුදේ කි. මී. 2 ක් දක්වා ප්‍රදේශයේ සිදුකෙරෙන ව්‍යාපෘති
- ජාතික රක්ෂිතයක මායිමේ සිට සැතපුමක් ඇතුලත ප්‍රදේශයේ සිදුකෙරෙන මහා පරිමාණ ව්‍යාපෘති
- පරිසරය මත සැලකිය යුතු බලපෑමක් සිදුකෙරෙන ව්‍යාපෘති
- සංවේදී පරිසර කලාපවල සිදුකෙරෙන ව්‍යාපෘති

ව්‍යාපෘතිය සිදුකෙරෙන ප්‍රදේශය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් හෝ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අදාල ව්‍යාපෘතියේ ස්වභාවය සලකා බලා එයට පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් සකස් කළයුතුද යන්න දැනුම් දෙනු ලබයි. අදාල ව්‍යාපෘතිය සිදුකරන ආයතනය විසින් උපදේශන ආයතනයක් මගින් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් සකස්කොට ඉදිරිපත් කළ පසු දින 30 ක කාළයක් මහජන අදහස් දැක්වීම් සඳහා එය විවෘත කෙරෙයි. ඊට සමාන්තරව වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙතද යොමු කෙරෙයි. මහජන අදහස් සහ තාක්ෂණික කමිටුවේ නිර්දේශ අනුව කොන්දේසි වලට යටත්ව ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීම සිදුවේ. එකී කොන්දේසි අනුව පාරිසරික බලපෑම අවම වන ආකාරයෙන් ව්‍යාපෘතිය පවත්වාගෙන යා යුතු අතර යම් හෙයකින් එකී කොන්දේසි කඩ කළහොත් ලබාදී ඇති අනුමැතිය අවලංගු කළ හැකිය.



# ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය (GRC)

## ලබාගැනීමේ මාර්ගෝපදේශය

අනන්‍යා : (ඇය) - අවුරුදු 26 ක් වයසැති සංක්‍රාන්ති කාන්තාවක් (transwoman). Gender Recognition Certificate (GRC) එක ගැන දැනගෙන තම ගමන ආරම්භ කිරීමට අවශ්‍යයි. කලුබෝවිල ප්‍රදේශයේ පදිංචිව ඇත.

ප්‍රශාන් : (ඔහු) - අවුරුදු 35 ක් වයසැති සංක්‍රාන්ති පුරුෂයෙක් (transman). වසර 2කට පෙර GRC ලබාගත් අතර, දැන් ප්‍රජාවට මගපෙන්වීම් ලබා දෙයි.

« පටුන වෙත

## GRC යනු කුමක්ද?

ප්‍රශාන් අයියේ, **GRC** එක ගැන මට කියන්නකෝ. මට තේරෙන්නෙ නෑ කොහෙන් පටන්ගන්නද කියලා?

GRC කියන්නේ **"ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා ගැනීමේ සහතිකය"**. 2016 අංක 01-34/2016 දරන "සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ" මගින් හඳුන්වා දුන්නෙ. රජයේ රෝහල් මගින් නිකුත් කරන නිල ලේඛනයක්. මෙය භාවිතා කරලා ඔයාට උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත (NIC) සහ ඔයාගෙ අධ්‍යාපන සහතික, පාස්පෝර්ට් (PASS PORT) එක වගේ නීත්‍යානුකූල ලියකියවිලි වෙනස් කරගන්න පුළුවන්.



# සුදුසුකම්

### මටත් **GRC** එක ගන්න පුළුවන් නේද අයියෙ?

ඔව් ඔයාට පුලුවන්. ඒකට ඔයා "අවම වයස අවුරුදු 16" වැඩිනම් **General Circular** 01-34-2016 යන රෙගුලාසියට අනුව එහෙම නැත්තන් අපි හැමෝම දන්න විදියට **GRC** සර්කියුලර් එකට අනුව ඔයාගෙ තනි කැමැත්තෙන් ඔයාට ඉල්ලුම් කරන්න පුලුවන්. වැදගත්ම දේ "ශල්‍යකර්මයකට කිසිසේත් **GRC** එක අනිවාර්ය නෑ" නමුත් **GRC** එක තියෙන එක අනවශ්‍ය බාධකවලට හොඳ පිලිතුරක් වෙන්න පුලුවන් ඔයාට.



# GRC ක්‍රියාවලිය - පියවරෙන් පියවර

### මම **GRC** ලබා ගන්න කොහෙටද යන්න ඕනෙ?

ශ්‍රී ලංකාවේ රෝහල් කිහිපයක සංක්‍රාන්ති සායන තියෙනවා: **කොළඹ ජාතික රෝහල, කලුබෝවිල, පේරාදෙණිය, ගාල්ල, යාපනය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, රත්නපුර, සහ අංගොඩ NIMH නවෝදය මධ්‍යස්ථානය ඒවයින් මූලික වෙනවා.**



**පියවර 1**
ඔයා රෝහලේ මානසික වෛද්‍ය සායනයට ගිහින් ලියාපදිංචි වෙන්න.

**පියවර 2**
මනෝ විශේෂඥ වෛද්‍ය තක්සේරුව - මේ ක්‍රියාවලියට සාමාන්‍යයෙන් "මාස 6 සිට අවුරුදු 2 දක්වා" කාලයක් ගත විය හැකියි. අදාල වෛද්‍යවරයා තමයි ඔබේ ස්ත්‍රී පුරුෂ භාවී අනන්‍යතාවය තහවුරු කර ගන්නෙ.

**පියවර 3**
අවශ්‍ය නම් හෝමෝන ප්‍රතිකාර සඳහා අන්තරාසර්ග විශේෂඥ වෛද්‍යවරයකු (Endocrinologist) වෙත යොමු කරනවා

**පියවර 4**
පසුව මනෝ විශේෂඥ වෛද්‍යවරයා සහ රෝහල් අධ්‍යක්ෂකගේ අත්සනින් GRC නිකුත් කරනවා.

**පියවර 5**
ඉන් පසු GRC රැගෙන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට (බත්තරමුල්ල) ගොස් උප්පැන්න සහතිකය වෙනස් කරගන්න.

**පියවර 6**
පසුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට ගොස් අලුත් ජාතික හැදුනුම්පතක් වෙනස් වූ ලිංගික අනන්‍යතාවයට අදාලව හදාගන්න.



# අවශ්‍ය ලේඛන, ගාස්තු සහ කාලය



මොන ලේඛනද මම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අරන් යන්න ඕනෙ? ගාස්තු එහෙම කීයද අයියෙ?

අවශ්‍ය ලේඛන මෙහෙමයි නංගි,

- රෝහල් ලේඛන (OPD සටහන්)
- මානසික රෝග විශේෂඥ වාර්තා
- රෝහල නිකුත් කරන GRC සහතිකය
- පැරණි උප්පැන්න සහතිකය
- පැරණි ජාතික හැඳුනුම්පත (NIC)
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අයදුම්පත

ගාස්තු :
රජයේ රෝහල්වලදී GRC එක නොමිලේ ලබා දෙනවා.

කාලය :
තක්සේරු කාලය සාමාන්‍යයෙන් මාස 6 සිට අවුරුදු 2 දක්වා (තක්සේරු කාලය) කාලයක් ගත වෙන්න පුළුවන්. සම්පූර්ණ ක්‍රියාවලියට අවුරුදු 2-3ක් ගත වෙන්න පුලුවන්.

# හෝමෝන ප්‍රතිකාර පිළිබඳ වැදගත් දැනුම්දීමක්

හෝමෝන ප්‍රතිකාර ගැන කියන්නකෝ.

හෝමෝන ප්‍රතිකාර සම්බන්ධයෙන් වැදගත්ම දෙයක් කියන්න ඕනේ. කිසිම හේතුවකට වෛද්‍ය උපදෙස් නැතුව හෝමෝන ලබා ගැනීම නිර්දේශ කරන්නෙ නෑ අපි. ඒක ගොඩක් අනතුරුදායක වෙන්න පුලුවන්.

එහෙනම් හෝමෝන ලබා ගන්නේ කොහොමද?



සායන වලදී මානසික රෝග විශේෂඥ වෛද්‍යවරුන් ඔයාව **"අන්තරාසර්ග විශේෂඥ වෛද්‍යවරුන් (Endocrinologist)"** වෙත යොමු කරනවා.
ඔවුන් තමයි හෝමෝන ප්‍රතිකාර නියම කළ යුත්තේ.

සංක්‍රාන්ති පුරුෂයින් සඳහා ටෙස්ටොස්ටෙරෝන් දෙනවා.
ඒකෙන්,

- **කටහඬ ගැඹුරු වීම**
- **මුහුණේ සහ සිරුරේ රෝම වර්ධනය**
- **ඔසප් වීම නතර වීම**
- **මාංශ පේශි වර්ධනයත්**

සංක්‍රාන්ති කාන්තාවන් සඳහා ඊස්ට්‍රජන් දෙනවා.
ඒකෙන්,

- **පියයුරු වල වර්ධනයක් වෙන්න පුලුවන්**
- **සම මෘදු වීම**
- **ඇගේ මේදය තැම්පත් වීම වෙන්න පුලුවන්**
- **ශිෂ්ණය ප්‍රාණවත් වීම අඩු වීම**

අනික් වැදගත්ම දේ තමයි,
මේ දේවල් වෙන්න ගතවෙන කාලය
කෙනාගෙන් කෙනාට වෙනස් වෙන්න පුලුවන්.

මොකද එකිනෙකාගෙ
ශාරීරික වෙනස් කම් නිසා.



# ශල්‍යකර්ම පිළිබඳ කෙටි සටහන



අයියෙ සර්ජරි (ශල්‍යකර්ම) මොනවාද තියෙන්නේ?

සංක්‍රාන්ති පුරුෂයින් බවට පත් වන අය සඳහා තියෙන සැත්කම් නම්,

- **ඉහළ ශල්‍යකර්මය (Top Surgery) පියයුරු පටක ඉවත් කිරීම**
- **හිස්ටරෙක්ටොමි (Hysterectomy) - ගර්භාෂය ඉවත් කිරීම**
- **ෆැලෝප්ලාස්ටි / මෙටොයිඩියෝප්ලාස්ටි - පුරුෂ ප්‍රජනක අවයව (ශිෂ්ණය) සැකසීම**

සංක්‍රාන්ති කාන්තාවන් බවට පත් වන අය සඳහා,

- **පියයුරු වැඩි කිරීම (Breast Augmentation)**
- **යෝනි මාර්ගය සැකසීම (Vaginoplasty)**

ශල්‍යකර්ම ස්ථාන:
**ශ්‍රී ලංකාවේ රජයේ සහ පෞද්ගලික රෝහල්**

විදේශ:
**තායිලන්තය, ඉන්දියාව, සිංගප්පූරුව, තුර්කිය**



# පූර්ව සැත්කම් සත්කාර



අයියේ සර්ජරි (ශල්‍යකර්මයකට) එකකට කලින් කළ යුතු දේවල් මොනවාද?

සැත්කමකට කලින් ලෑස්තිවෙන්න ඕනෙ ප්‍රධාන කරුණු කීපයක් තියෙනවා නංගි,

1. වෛද්‍ය හමුවීම් : **සර්ජරි එක කරන ඩොකටර් ව (ශල්‍ය වෛද්‍යවරයා) කිහිප වතාවක් මුණගැහිලා සැත්කම ගැන සාකච්ඡා කරන්න.**

2. වෛද්‍ය පරීක්ෂණ : **රුධිර පරීක්ෂණ, අක්මාව/වකුගඩු ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර ශල්‍යකර්මයට සුදුසු ද කියල තහවුරු කරගන්න.**

3. හෝමෝන ප්‍රතිකාර : **බොහෝ ශල්‍යකර්ම සඳහා ශල්‍යකර්මයට පෙර හෝමෝන නතර කරන්න සිදුවෙනවා. ඒ නිසා වෛද්‍ය උපදෙස් අනුවම කටයුතු කරන්න.**

4. ජීවන රටාවෙ වෙනස්කම් : **දුම්පානය, මත්පැන් භාවිතය අවම කරන්න. නතරම කරනවානම් වඩා හොඳයි.**

5. ප්‍රායෝගික සූදානම : **සුවය සඳහා ප්‍රමාණවත් නිවාඩු ගන්න. අවශ්‍ය භාණ්ඩ සූදානම් කර තබාගන්න.**

« පටුන වෙත

# පසු සැත්කම් සත්කාර



සර්ජරි එකෙන් පස්සෙ කොහොමද අයියෙ අපි පරිස්සම් වෙන්න ඕනෙ? පසු කළ යුතු දේවල් මොනවාද?

සර්ජරි එකෙන් පස්සෙ අපි සැලකිලිමත් වෙන්න ඕනෙ ප්‍රධාන කරුණු කීපයක් තියෙනවා:

1. තුවාල සත්කාර:
**තුවාල ඇති තැන් වියළිව හා පිරිසිදුව තබා ගන්න.**
**නියමිත පරිදි වෙළුම් පටි වෙනස් කරන්න.**

2. ඖෂධ:
**වේදනා නාශක නියමිත වේලාවට ගන්න.**
**ප්‍රතිජීවක ඖෂධ නියමිත පරිදි සම්පූර්ණයෙන් ලබා ගන්න.**

3. විශේෂ උපදෙස්:

ඉහළ ශල්‍යකර්මය:
**සම්පීඩන ඇඳුම නිතරම ඇඳ සිටින්න.**

යෝනි මාර්ගය සැකසීම:
**නියමිත පරිදි ඩයිලේෂන් නිතිපතා කරන්න.**

4. සැලකිලිමත් විය යුතු කරුණු:
- **උණ, දැඩි වේදනාව, තුවාලයෙන් සැරව ගැලීම වැනි අසාමාන්‍යතා ඇත්නම් වහාම වෛද්‍යවරයාට දන්වන්න**
- **නියමිත පශ්චාත් ශල්‍ය හමුවීම්වලට සහභාගී වන්න**

5. සනීපාරක්ෂාව:
- **තුවාල ඇති තැන් තෙමීමෙන් වළකින්න**
- **අත් නිතර සෝදන්න**
- **යට ඇඳුම් නිතර මාරු කරන්න**



« පටුන වෙත

# GRC ක්‍රියාවලිය අතරතුර ප්‍රතික්ශේප වීමක් හෝ/ අයුතු සැලකිල්ලක් වුවහොත්



යම් ප්‍රශ්නයක් ආවොත්?

ඔයාව ප්‍රතික්ෂේප වුවහොත්

- වෙනත් වෛද්‍යවරයකු හමුවෙන්න (තවත් වෛද්‍යවරයකුගේ මතයක් ලබා ගන්න පුලුවන්)
- වෙනත් රෝහලකට යන්න.
- මානව හිමිකම් කොමිසමට (HRCSL) පැමිණිලි කරන්න.

අයුතු සැලකිල්ලක් වුවහොත්:

**HRCSL:** ගාස්තු අය කරන්නෙ නෑ, සම්පූර්නයෙන්ම නොමිලේ, නීතිඥයෙක් අවශ්‍ය නැහැ, කාල සීමාවක් නැහැ

**FR** පෙත්සම:
උල්ලංඝනය සිදු වූ දින සිට මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය පිලිබද පෙත්සමක් ඉදිරිපත් කරන්න පුලුවන්. ඒ සදහා නීතිඥයෙකු සිටීම උදව්වක් විය හැකියි. නොඑසේ නම් තමා විසින්ම වුවද අදාළ පෙත්සම ඉදිරිපත් කල හැකිය.

පොලිස් පැමිණිලි:
2022 පොලිස්පති චක්‍රලේඛය යටතේ පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නත් පුලුවන්.



« පටුන වෙත

# අවසාන ව

අයියේ, හැම දෙයක්ම පැහැදිලි කළාට ගොඩක් ස්තූතියි. විශේෂයෙන්ම වෛද්‍ය උපදෙස් නැතුව හෝමෝන නොගත යුතු බව කිව්ව එක වැදගත්.

**ඔව්, ඒක හරිම වැදගත්. මතක තියාගන්න මේ දේවල්:**

- **ශල්‍යකර්මය GRC එකට අනිවාර්ය නැහැ**
- **GRC රජයේ රෝහල්වල නොමිලේ**
- **වෛද්‍ය උපදෙස් නැතුව හෝමෝන ලබා ගැනීම නිර්දේශ නොකරයි**
- **සායන මගින් අන්තරාසර්ග විශේෂඥ වෛද්‍යවරුන් වෙත යොමු කරනු ඇත**
- **ශල්‍යකර්ම සඳහා පූර්ව සහ පශ්චාත් සත්කාර අත්‍යවශ්‍යයි**
- **ශල්‍යකර්ම ලංකාවේ සහ විදේශ රට වලද කරගන්න පුළුවන්**
- **අයුතු සැලකිල්ලක් වුණොත් HRCSL, FR, පොලීසියට පැමිණිලි කරන්න පුළුවන්**
- **උදව් සඳහා සංවිධාන තියෙනවා**



හෙටම මම රෝහලට ගිහින් විමසන්නම්. ස්තූතියි ප්‍රශාන් අයියේ!

ඔයාගේ ගමනට සුභ පැතුම්! ඔයා තනිවෙලා නෑ.



« පටුන වෙත

# තොරතුරු දැනගැනීමේ අයිතිය

**පොදු අධිකාරියක් සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය සෑම පුරවැසියෙකුට ම තිබිය යුතුය. (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත)**



හායි, මම නිශා. මම කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රජා නායිකාවක්.

මම වැඩ කරන ප්‍රජාවට 2021 අවුරුද්දේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ක්‍රිෂ්ණපුරම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සමෘද්ධි ප්‍රතිලාභීන් කීදෙනෙක් සිටියාද යන්න දැනගැනීමට අවශ්‍යයි. ඒ වගේම එම සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තුවත්, ඒ අතරින් සමෘද්ධි ආධාර මුදල නොලැබුණු අයගේ නම් ලැයිස්තුවත් අපිට අවශ්‍යයි. මම ඒ සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ ඉල්ලීමක් සිදු කිරීමට තීරණය කළා. අපි බලමු කොහොමද ඒක කරන්නෙ කියලා. ඒකට පියවරයන් කිහිපයක් තියෙනවා

**මා මුලින්ම කළ යුත්තේ කුමක්ද?**

## 1 වෙනි පියවර පොදු අධිකාරිය හඳුනා ගැනීම

කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## 2 වෙනි පියවර පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සම්පූර්ණ කිරීම

ලිඛිතව (විද්‍යුත් මාර්ගයෙන් කරන ඉල්ලීම් ද ඇතුලත්ය) මෙන්ම වාචිකව ද සිදු කල හැක.

ඉල්ලුම්කරු

- කණ්ඩායමක් වන්නේ නම් - කණ්ඩායමේ පුද්ගලයන්ගේ නම් ලැයිස්තුව ඇමිණිය යුතුය
- පුරවැසියා යන්නට යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩල ද ඇතුළත් වේ (43 වන වගන්තිය - අර්ථ නිරූපණ වගන්තිය)



(තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ තොරතුරු ඉල්ලා සිටින පෝරම අංක 01 සඳහා පිටු අංක 6 බලන්න)

# 3 වෙනි පියවර පොදු අධිකාරියේ තොරතුරු නිළධාරී වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ඉදිරිපත් කිරීම - 24(1) වගන්තිය



- පෞද්ගලිකව
- ලියාපදිංචි තැපැල් මගින්
- විද්‍යුත් තැපෑලෙන් යොමු කල හැක

භාර දුන් බවට සාක්ෂි ලග තබා ගන්න

## ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටීම

මෙහිදී වැඩ කරන දින 14 ක් ඇතුලත සාමාන්‍යයෙන් ප්‍රතිචාරයක් දිය යුතුයි

එම ආයතනයට තොරතුරු සැපයීමට තවදුරටත් කාලය අවශ්‍ය නම් වැඩ කරන දින 21 ක් ඇතුලත ප්‍රතිචාරයක් දිය යුතුයි

ඉල්ලා සිටින තොරතුරු යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක පැය 48 ක් ඇතුළත ප්‍රතිචාරයක් දිය යුතුයි

25 වගන්තිය බලන්න



නිශාට අපේක්ෂා කල තොරතුරු ලැබී ඇති හෙයින් ඇය එම තොරතුරු ඇගේ ප්‍රජාව සමග බෙදා ගනී

ඇයට මෙම කාල සීමාවන් තුල තොරතුරු නොලැබුණේ නම් හෝ ප්‍රතිචාරයන් නොලැබුනේ නම් නිශා විසින් පහත පියවරයන් අනුගමනය කල යුතුය

### තොරතුරු ලබා නොදුන්නේ නම් එයට හේතු

- 5* වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරක් වීම 31(1)(ආ) වගන්තිය
- පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම 31(1)(ඇ) වගන්තිය
- සපයන ලද තොරතුරු අසම්පූර්ණ, නොමග යවන සුළු හෝ සාවද්‍ය වීම 31(1)(ඈ) වගන්තිය
- වැඩිපුර ගාස්තු අය කිරීම 31(1)(ඉ) වගන්තිය
- ඉල්ලා සිටින ආකෘතියට අනුව තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කිරීම 31(1)(ඊ) වගන්තිය
- තොරතුරු වෙත ප්‍රවේශ වීම වැළැක්වීමට ඒවා විකෘතිකර, විනාශකර හෝ අස්ථානගතකර ඇති බව විශ්වාස කිරීමට පුරවැසියාට සාධාරණ හේතු තිබීම 31(1)(උ) වගන්තිය



නිශා ඉල්ලා සිටින ඇතැම් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සඳහා පනතේ විධිවිධාන සපයා ඇත. එලෙස ප්‍රතික්ෂේප කරනු ලැබීමට පදනම් විය හැකි හේතු පහත වේ

*5 වෙනි වගන්තිය - තොරතුරු වෙත ප්‍රවේශය ලබාදීම ප්‍රතික්ෂේප කිරීමේ පදනම් පහත වගන්ති වලින් දක්වා ඇත. කෙසේ නමුත් ඒ සඳහාද ව්‍යතිරේඛ පවතින බැවින් එම විශේෂ ව්‍යතිරේඛ සඳහා පනතේ පහත වගන්ති කියවන්න.

5(1)(අ) පුද්ගලික තොරතුරු

5(1)(ආ)(i) රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට බරපතල ලෙස අගතිදායක වන තොරතුරු

5(1)(ආ)(ii) රාජ්‍යක් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් මගින් රහසිගතව ලබාදුන් හෝ රහසිගතව ලබාගත් තොරතුරු

5(1)(ඇ) තොරතුරු හෙළිදරව් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බරපතල අගතියක් සිදුවිය හැකි අවස්ථාවක

5(1)(ඈ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂා කර ඇති වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළ ඇතුළු තොරතුරු

5(1)(ඉ) යම් පුද්ගලයෙකුට අදාළ වෛද්‍ය වාර්තා

5(1)(ඊ) සේවා සැපයීමේ දී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධරයකු සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තිකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරු

5(1)(උ) භාරකාර සම්බන්ධතාවයක් පැවතීම හේතුවෙන් රහසිගතව තබා ගත යුතු වන තොරතුරු

5(1)(ඌ)(i) කිසියම් අපරාධයක් වැළැක්වීමට හෝ අනාවරණය කර ගැනීමට හෝ වැරදිකරුවන් අල්ලා ගැනීමට හෝ නඩු පැවරීමට බලවත් අගතියක් ඇති කරන තොරතුරු

5(1)(ඌ)(ii) නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාවට අදාළ තොරතුරු පිළිබඳ රහසිගත මූලාශ්‍රයක අනන්‍යතාවය හෙළිදරව් වන තොරතුරු

5(1)(එ) තෙවන පාර්ශවයක් විසින් අදාළ පොදු අධිකාරිය වෙත රහසිගතව සපයා ඇති තොරතුරු

5(1)(ඒ) හෙළිදරව් කිරීම මගින් අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය සහ අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාමට අගතියක් වන තොරතුරු

5(1)(ඔ) හෙළිදරව් කිරීම මගින් පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ පළාත් සභා වරප්‍රසාද උල්ලංඝණය වන තොරතුරු

5(1)(ඕ) විභාග දෙපාර්තමේන්තුව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වනු ලබන යම් විභාගයකට අදාළ තොරතුරු

5(1)(ක) තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් සම්බන්ධයෙන් වන තොරතුරු

5(1)(ග) මැතිවරණය නීති මගින් රහසිගතව තැබීමට නියමිත වන්නා වූ මැතිවරණයකට සම්බන්ධ තොරතුරු

නමුත්,

5(2) - (1) වන උපවගන්තියේ විධිවිධාන වල කුමක් සඳහන්ව තිබුණ ද, ඉල්ලා සිටින තොරතුරු වසර දහයකට වඩා පැරණි නම්, එම උපවගන්තියේ (අ), (ආ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) සහ (ඒ) ඡේදවල දක්වා ඇති හේතු මත හැර එහි දක්වා ඇති කිසිදු හේතුවක් මත, තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

5(3) - වසර දහයක් ඉකුත් වීමෙන් පසුව වුවද අවසන් වී නොමැති යම් විදේශීය ගිවිසුමකට අදාළ තොරතුරු හෙළි නොකළ යුතුය.

5(4) - (1) වන උපවගන්තියෙහි කුමක් සඳහන් වුව ද, මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

5(5) - (1) වෙනි උප වගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇති යම් තොරතුරක් වෙත ප්‍රවේශය ලබා දීම හා සම්බන්ධ යම් ගැටළුවක් පිළිබඳව තොරතුරු නිලධාරියෙකුට කොමිෂන් සභාවෙන් උපදෙස් ලබා ගත හැකි අතර, කොමිෂන් සභාව හැකි ඉක්මනින් සහ එවැනි සෑම අවස්ථාවක දී ම දින 14ක් ඇතුළත ස්වකීය උපදෙස් ලබා දිය යුතු ය.

« පටුන වෙත

**නිශාට තොරතුරු නිලධාරියාගෙන් තොරතුරු නොලැබුණු විට, ඇයට කළ හැක්කේ කුමක්ද?**

මට ඒ සඳහා විකල්පයක් තිබෙනවා.

එම විකල්පය නම් ...

## 4 වෙනි පියවර පොදු අධිකාරියේ නම් කළ නිලධාරී වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම 31(1) වගන්තිය

ප්‍රතික්ෂේප කිරීම, ක්‍රියාව හෝ අභියාචනයක් කිරීම සදහා හේතු පවතින බව දැනගත් දින සිට දින 14ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කල හැක



එසේ වුවද නිශාට (අභියාචකට) පාලනය කළ නොහැකි හේතුවක් නිසා අභියාචනය ගොනු කල නොහැකි වූවේනම් සහ එම හේතූන්ගෙන් නම් කළ නිළධාරියා සෑහිමකට පත්වේ නම් පමණක් දින 14 ක කාල සීමාව අවසන් වීමෙන් පසුව වුවද නිළධාරියාට අභියාචනය භාරගත හැකිය.

සම්පූර්ණ කරන ලද අභියාචනා පෝරමය සදහා පිටු අංක 7 බලන්න



නම් කරන ලද නිලධාරියාගේ ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටීම - සති 3 31(3) වගන්තිය

නිශාට අපේක්ෂා කල තොරතුරු ලැබී ඇති හෙයින් ඇය එම තොරතුරු ඇගේ ප්‍රජාව සමග බෙදා ගනී



නිශා අභියාචනයේ තීරණයෙන් අගතියට පත් වුනේ නම් (32(1)(අ)) වගන්තිය
හෝ
ඇයට සති 3 ක් ඇතුළත පිළිතුරක් නොලැබුනේ නම් (32(1)(ආ)) වගන්තිය

පහත පියවරයන් අනුගමනය කල හැකිය



## 5 වෙනි පියවර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම 32(1) වගන්තිය



නිශාට කොමිසමට අභියාචනා කිරීමට අදාල වන කාලසීමාව - 4 වන පියවරේදී නම් කළ නිළධාරියාගේ තීරණය නිශාට දැනුම් දීමෙන් මාස දෙකක් ඇතුළත හෝ අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට ලබා දී ඇති නිශ්චිත කාලය ඉකුත්වීමෙන් මාස දෙකක් ඇතුළත ඇයට කොමිසමට අභියාචනා කල හැක

එසේ වුවද නිශාට (අභියාචකට) පාලනය කළ නොහැකි හේතුවක් නිසා නියමිත කාලයේදී කොමිසමට අභියාචනය ගොනු කල නොහැකි වූවේනම් සහ එම හේතුන්ගෙන් කොමිසම සෑහිමකට පත්වේ නම් පමණක් මාස 2 ක කාල සීමාව අවසන් වීමෙන් පසුව වුවද කොමිසමට අභියාචනය භාරගත හැකිය. 32(2) වගන්තිය



සම්පූර්ණ කරන ලද කොමිසමට ඉදිරිපත් කරනු ලබන අභියාචනා පෝරමය සදහා පිටු අංක 8 බලන්න

නිශාට අපේක්ෂා කල තොරතුරු ලැබී ඇති හෙයින් ඇය එම තොරතුරු ඇගේ ප්‍රජාව සමග බෙදා ගනී



කොමිෂන් සභාව විසින් ලබා දුන් තීරණයෙන් අතෘප්තියට පත්වීම



එසේ නම් තොරතුරු ලබා ගැනීම සඳහා මට කළ හැක්කේ කුමක්ද?

මට ඒ සඳහා විකල්පයක් තිබේ

එම විකල්පය නම්...



## 6 වෙනි පියවර අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම 34(1) වගන්තිය

(කොමිෂන් සභාව විසින් අභියාචනයේ තීරණය දැනුම් දෙනු ලැබූ දිනයේ සිට මාසයක් ඇතුළත)



**RTI 01**

## තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය

මෙම අයදුම්පත්‍රය පිරවීම අත්‍යවශ්‍ය නොවේ. මෙය පැහැදිලිව තොරතුරු ඉල්ලීමට ඔබගේ පහසුව සඳහා පිළියෙල කර ඇත.අත්‍යවශ්‍ය තොරතුරු පැහැදිලිව සඳහන් කරමින් ලිපියක්, විද්‍යුත් තැපැල් පණිවිඩයක් හෝ වාචික ඉල්ලීමක් ඔබට කල හැක.

**තොරතුරු නිලධාරී,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**කරච්චි.**

| | | |
|---|---|---|
| 01. | අයදුම්කරුගේ නම | **නිශා සුන්දරලිංගම්** |
| 02. | ලිපිනය | අංකඃ 00, **පරන්තන්, කිලිනොච්චිය.** |
| 03. | දුරකථන අංකය (තිබේනම්) | 071 0000000 |
| 04. | විද්‍යුත් ලිපිනය (තිබේනම්) | **kkkkk@gmail.com** |
| 05. | ඉල්ලා සිටින තොරතුරු පිළිබඳ විස්තර, (ඉඩමදි නම් වෙනම ලියාඅමුණන්න) | |
| | I. අදාළ ආයතනය | **කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** |
| | II. ඉල්ලා සිටින තොරතුරු | **2021 වර්ෂයේ දී කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ක්‍රිෂ්ණපුරම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව, එම සමෘද්ධි ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර ඇතුළත් නම් ලැයිස්තුව සහ සමෘද්ධි ආධාර මුදල් නොලැබුණු ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තුව** |
| | III. තොරතුරුවලටඅදාල කාල පරිච්ඡේදය | 2021 |
| 06. | තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන ආකාරය **(අනවශ්‍ය කොටස් කපාහරින්න)** | **තොරතුරු ඇතුළත් ලියවිලිවල සහතික කළ පිටපත්**<br>(අ)අදාළවැඩ, ලේඛන,වාර්තා අධීක්ෂණය කිරීම සඳහා,<br>(ආ)අදාළලේඛන හෝ වාර්තාවලින් සටහන්, උද්ධෘත හෝ සහතික පිටපත් ලබාගැනීම,<br>(ඇ)අදාළ ද්‍රව්‍යයන්ගේ සහතික කළ නිදර්ශන ලබා ගැනීම,<br>(ඈ)එම තොරතුරු පරිගණකයක හෝ වෙනත් යම් උපාංගයක ගබඩාකර ඇති අවස්ථාවකදී, ඩිස්කට්, ෆ්ලොපි, පටි, දෘෂ්‍ය කැසට්පට හෝ වෙනත් යම් විද්‍යුත් ක්‍රමයකින් හෝ මුද්‍රිත පිටපත් වශයෙන් තොරතුරු ලබා ගැනීම |
| 07. | ඉල්ලුම්කරු වඩාත් කැමති භාෂා මාධ්‍යය | **සිංහල** |
| 08. | ඉල්ලා සිටිනු ලබන තොරතුරු ජීවිතය සහ පුද්ගලිකත්වය ආරක්ෂාකර ගැනීමට අදාල බවට විශ්වාස කරන්නේනම් එය තහවුරු කරන කරුණු | නැත |
| 09. | වෙනත් විස්තර | |
| 10. | පහත දැක්වෙන ලියවිලි පිටපත් අමුණා ඇත.(තිබේ නම් පමණි)<br>I.<br>II.<br>III. | |
| 11. | ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? | ඔව් / නැත : **ඔව්** |

දිනය : 2022-09-08 අත්සන : **නිශා**

« පටුන වෙත

## නම් කළ නිලධාරියා වෙත යවන අභියාචනා අයදුම් පත්‍රය

**නම් කළ නිළධාරි,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**කරච්චි.**

01. අයදුම්කරුගේ නම : **නිශා සුන්දරලිංගම්**

02. ලිපිනය : **අංකː 00, පරන්තන්, කිලිනොච්චිය.**

03. දුරකථන අංකය : 071 0000000

04. විද්‍යුත් ලිපිනය (තිබේ නම්) : kkkkk@gmail.com

05. තොරතුරු ලබා ගැනීමට තොරතුරු නිළධාරියා වෙත යැවූ ඉල්ලුම්පතේ දිනය සහ ලි.ප. අංකය : 2022-09-08

06. තොරතුරු නිලධාරියාගෙන් පිළිතුරු ලැබුණේද? ඔව්/නැතː **නැත**
(ඔව් නම් ලැබුණු පිළිතුරු පිටපත අමුණන්න)

07. අභියාචනය පදනම් කරගත් හේතුː **පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන්ට අනුකූල නොවීම. අවශ්‍ය තොරතුරු ඉල්ලා කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධාරියා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ නමුත් වැඩ කරන දින 14 ක් ඇතුළත තොරතුරු නිලධාරියාගෙන් කිසිදු පිළිතුරක් නොලැබුණි.**

i. තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම
ii. 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම
iii. මේ පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන්ට අනුකූල නොවීම
iv. සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම
v. වැඩිපුර ගාස්තු අය කිරීම
vi. ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම
vii. එම තොරතුරු වෙත ප්‍රවේශ වීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘති කර, විනාශ කර හෝ අස්ථානගත කර ඇති බවට එම තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම
viii. දින 14 කාලය ඉක්මවා අමතර කාලයක් ඉල්ලීමේ හේතු සාධාරණ නොවීම
(අදාළ නොවන කරුණු කපා හරින්න)

08. අවශ්‍ය කරන තොරතුරු (එහි විස්තර, අදාළ කාලය හා විෂයන්) : 2021 **වර්ෂයේ දී කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ක්‍රිෂ්ණපුරම් ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව, එම සමෘද්ධි ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර ඇතුළත් නම් ලැයිස්තුව සහ සමෘද්ධි ආධාර මුදල් නොලැබුණු ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තුව.**

09. අභියාචනය දින 14 තුල ඉදිරිපත් නොකිරීමට හේතු (තිබේනම්)ː

10. වෙනත් කරුණුː

දිනයː 2022-09-29 අත්සනː **නිශා**

« පටුන වෙත

ඇමුණුම 01

අභියාචන ආකෘතිය

**<u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනය</u>**

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203-204,**
**බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,**
**බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

**අභියාචන පෝරමය**

01. අභියාචකගේ නම : **නිශා සුන්දරලිංගම්**

02. ලිපිනය : **අංකඃ 00, පරන්තන්, කිලිනොච්චිය.**

03. දුරකථන අංකය (තිබේ නම්) : 071 0000000

04. විද්‍යුත් ලිපිනය (තිබේ නම් : kkkkk@gmail.com

05. බලයලත් නියෝජිතයාගේ (සිටියි නම්) නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තරඃ

**A මහතා (නීතිඥ)**

**දුරකථන අංක :** 077 0000000

06. අදාළ පොදු අධිකාරියේ නමඃ **කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

07. අදාළ තොරතුරු නිලධාරියාගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තරඃ

**තොරතුරු නිලධාරී**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**කරච්චි.**
021 0000000

08. තොරතුරු නිලධාරියාට තොරතුරු ඉල්ලීම් කළ දිනය සහ ලියාපදිංචි අංකයඃ 2022-09-08

(තොරතුරු ඉල්ලීමේ පිටපතක් අමුණන්න) - **ඇමුණුම 01**

09. තොරතුරු නිලධාරියාගෙන් ඔබට පිළිතුරක් ප්‍රතිචාරයක් ලැබුණාද? ඔව්/නැතඃ **නැත**

(තොරතුරු ඉල්ලීමේ පිටපතක් අමුණන්න)

10. තොරතුරු නිලධාරියාගෙන් තීරණය ලැබුණු දිනයඃ **නැත**

11. එම තීරණයට විරුද්ධව අභියාචනය කළ නිලධාරියාගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තරඃ

**නම් කළ නිලධාරී,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**කරච්චි**
0210000000

12. නම් කළ නිලධාරියාට අභියාචනය සිදු කළ දිනය සහ අභියාචන අංකයඃ 2022-09-29

13. නම් කළ නිලධාරියාගෙන් ඔබට තීරණයක් ලැබුණේද? ඔව්/නැතඃ **නැත**

**ඇමුණුම 02**

14. නම් කළ නිලධාරියාගෙන් ඔබට තීරණය ලැබුණු දිනයඃ **නැත**

15. අභියාචනය කිරීමේ පදනමඃ **මම තොරතුරු ඉල්ලා කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධාරියාට සහ නම් කළ නිලධාරියාට ඉල්ලීම් ඉදිරිපත් කළෙමි. නමුත් අදාළ කාලසීමාවන් තුළ කිසිදු ප්‍රතිචාරයක් මා වෙත නොලැබුණි. මා හට මෙම තොරතුරු අවශ්‍ය බැවින් කරුණාකර මෙම අභියාචනය සලකා බලන්න.**

16. අභියාචනයේ දී ඉල්ලා සිටි තොරතුරු (වැඩිදුර විස්තර, කාලසීමාව සහ විෂය)ඃ **2021 වර්ෂයේ දී කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ක්‍රිෂ්ණපුරම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව, එම සමෘද්ධි ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර ඇතුළත් නම් ලැයිස්තුව සහ සමෘද්ධි ආධාර මුදල් නොලැබුණු ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තුව.**

17. තීරණය ඉල්ලා සිටි දිනයඃ **නැත**

18. විශේෂිත කාල පරිච්ඡේදය තුළ අභියාචනය ඉදිරිපත් කර නැති නම් එම ප්‍රමාදය සඳහා හේතුවඃ [32(2) වගන්තිය]ඃ **නැත**

19. මෙකී ගැටලුව සම්බන්ධයෙන් මීට පෙර කොමිෂන් සභාව වෙත අභියාචනයක් කර තිබේද? **නැත**

20. වෙනත් ඕනෑම විස්තරයක් (තොරතුරු ඉල්ලීම පුරවැසියෙකුගේ ජීවිතය සහ නිදහස සම්බන්ධයෙන්ද යන්න ඇතුළත්ව)ඃ

21. අමුණා ඇති ලියකියවිලි වල ලැයිස්තුවක් :

**ඇමුණුම 01 - තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කළ ඉල්ලීම**

**ඇමුණුම 02 - නම් කළ නිලධාරියා වෙත ඉදිරිපත් කළ ඉල්ලීම**

**« පටුන වෙත**

දිනයඃ 2022.10.30

අත්සනඃ **නිශා**

# මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම්



හලෝ නිමල්, අරගලයෙන් පස්සේ ගතවුණු මේ අවුරුදු හතර ඇතුළත මානව හිමිකම් උල්ලංඝනය වීම් රාශියක් ගැන මට අහන්න ලැබුණා. ඔයා මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් ගැන දන්නවද?



මම ඒ ගැන ටිකක් අහලා තියෙනවා. හැබැයි මට ඒ ගැන පැහැදිලි අදහසක් නැහැ. ඒ දෙකම එකක් නෙවෙයිද?



ඒවා එකිනෙකට සම්බන්ධයි, හැබැයි එක සමාන නෑ. ලෝකයේ සෑම පුද්ගලයෙකුටම, ඔවුන් මනුෂ්‍යයන් වීම නිසාම හිමිවන මූලික අයිතිවාසිකම් සහ නිදහස අපිට මානව හිමිකම් යනුවෙන් හඳුන්වා දෙන්න පුළුවන්. මේ අයිතිවාසිකම් විශ්වීයයි, අත්හැරීමට නොහැකියි, වගේම රටක නීතිවලින් ස්වාධීනයි.



එතකොට, මේවා හැමතැනටම අදාළ වෙනවද?



ඔව්, මානව හිමිකම් විශ්වීයයි. ඒවා මනුෂ්‍යයෙකු වීම නිසා අනිවාර්යයෙන්ම හිමිවන අතරම, ජාත්‍යන්තර නීති සහ සම්මුතීන් මගින් පිළිගෙන තිබෙනවා.

උදාහරණ විදිහට:

- ★ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR)
- ★ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR)
- ★ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR)



එහෙනම් මූලික අයිතිවාසිකම් කියන්නේ මොනවාද?

« පටුන වෙත



විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මානව අයිතිවාසිකම් අපි මූලික අයිතිවාසිකම් යනුවෙන් හඳුනා ගන්නවා. විශේෂයෙන්ම 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වැනි පරිච්ඡේදය (10-17 ව්‍යවස්ථා) මගින් මේ මූලික අයිතිවාසිකම් ගැන දක්වා තිබෙනවා.



ඒවා මානව හිමිකම් වලට සමානද?



සමහරක් සමානයි, නමුත් ප්‍රධානතම වෙනස වන්නේ මෙම මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සියලු ම ශ්‍රී ලාංකිකයන්ට, විශේෂයෙන්ම රජයේ සියලු ම ආයතනවලට නීත්‍යානුකූල බැඳීමක් පැවතීම.



ඔයාට පුළුවන්ද වෙනස්කම් පැහැදිලි කරන්න?



ඇත්තටම තාක්ෂණික කරුණු හැරුණු විට ලොකු වෙනසක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ පොදු ජාත්‍යන්තර නීතිය අතර වෙනසක් පවතිනවා.

| මානව හිමිකම් | මූලික අයිතිවාසිකම් |
|---|---|
| 1. විශ්වීයයි - සෑම තැනකටම අදාළ වේ. (ඔබ මනුෂ්‍යයෙකු ලෙස උපන් නිසා) | ශ්‍රී ලංකාව තුළ පමණක් අදාළ වේ (ඔබ රටේ පුරවැසියෙකු නිසා සහ සමහර ප්‍රතිපාදන පුරවැසියන් නොවන අයටද අදාළ වේ, උදා: 13 වැනි ව්‍යවස්ථාව) |
| 2. ජාත්‍යන්තර නීතිය මත පදනම් වේ. | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් වේ (මූලික අයිතිවාසිකම් වඩ වඩාත් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හරහා අර්ථ නිරූපණය කෙරේ; ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාත්‍යන්තර මානව හිමිකම් නීති ප්‍රමිතීන් මත දැඩි ලෙස විශ්වාසය තබයි). |
| 3. සෘජුව බලාත්මක කළ හැකිය. | සෑම විටම සෘජුව බලාත්මක කළ නොහැක ශ්‍රී ලංකාවේ අධිකරණ තුළ - ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. නැතහොත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) වෙත පැමිණිලි කළ හැකිය. |
| 4. පුළුල් පරාසයක් පවතී | වඩාත් නිශ්චිත සහ සීමිත ලැයිස්තුවකි |

උදාහරණ:

## ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම්

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (iii වැනි පරිච්ඡේදය)**

10 වැනි ව්‍යවස්ථාව - සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස
11 වැනි ව්‍යවස්ථාව - වදහිංසාවලින් නිදහස
12 වැනි ව්‍යවස්ථාව - සමානාත්මතාවයේ අයිතිය
13 වැනි ව්‍යවස්ථාව - අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ, අතීතයට බලපාන පරිදි දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම
14 වැනි ව්‍යවස්ථාව - භාෂණයේ සහ ප්‍රකාශනයේ, සාමකාමීව රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ, යාමේ ඊමේ නිදහස
14අ වගන්තිය - තොරතුරු දැනගැනීමේ අයිතිය.

## මානව හිමිකම්

**මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR)**

1 වැනි වගන්තිය - සියලු ම මිනිසුන් නිදහස්ව උපදිති. ඔවුන් ගෞරවයෙන් සහ අයිතිවාසිකම් වලින් සමාන වේ.
2 වැනි වගන්තිය - ජාතිය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලන අදහස් හෝ වෙනත් කිසිදු වෙනසක් නොමැතිව සියලු ම පුද්ගලයන්ට මෙම ප්‍රකාශනයේ සඳහන් සියලු ම අයිතිවාසිකම් භුක්ති විඳීමට අයිතිය ඇත.
3 වැනි වගන්තිය - ජීවත්වීමට, නිදහසේ ජීවත් වීමට සහ පුද්ගලික ආරක්ෂාවට ඇති අයිතිය.
4 වැනි වගන්තිය - කිසිදු පුද්ගලයෙකු දාසභාවයට හෝ බැඳීම්වලට ලක් නොකළ යුතුය. සියලු  ආකාරයේ වහල්කම් සහ වහල් වෙළඳාම්  තහනම් වේ.
5 වැනි වගන්තිය - වදහිංසාවට හෝ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට යටත් නොකළ යුතුය.
6 වැනි වගන්තිය - නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීමේ අයිතිය.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR)**

1 වැනි වගන්තිය - සියලු ම මිනිසුන්ට ස්වයං නිර්ණ අයිතිය ඇත
2 වැනි වගන්තිය - වෙනස් කොට නොසැලකීම, සහ රජය අයිතිවාසිකම්වලට ගරු කළ යුතු අතර ම ඒවා ඉටු කර ගැනීම සඳහා ඵලදායී ප්‍රතිකර්ම සැලසිය යුතුය.
3 වැනි වගන්තිය - සියලු ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට පුරුෂයින්ට හා ස්ත්‍රීන්ට ඇති සමාන අයිතිය සහතික කිරීම.
6 වැනි වගන්තිය - සහජයෙන්ම හිමි ජීවත්වීමේ අයිතිය.
7 වැනි වගන්තිය - වධහිංසාවලට ලක් කිරීමෙන් ආරක්ෂා වීමේ අයිතිය.
8 වැනි වගන්තිය - වහල්භාවයෙන් ආරක්ෂා වීමේ අයිතිය.

**ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR)**

6 වැනි වගන්තිය - රැකියාවක නිරත වීමේ අයිතිය: තමා කැමත්තෙන් තෝරා ගන්නා හෝ පිළිගන්නා කාර්යයක නිරත වීමෙන් ජීවිකාව ගෙනයාමේ අයිතිය
8 වැනි වගන්තිය - වෘත්තීය සමිති පිහිටුවීමට සහ ඒවාට බැඳීමට ඇති අයිතිය.
9 වැනි වගන්තිය - සමාජ රක්ෂණය ඇතුළු සමාජ ආරක්ෂණය සඳහා සෑම පුද්ගලයෙකුටම ඇති අයිතිය.
11 වැනි වගන්තිය - ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස ඇතුළු ප්‍රමාණවත් ජීවන මට්ටමකට සහ අඛණ්ඩව වැඩිදියුණු වන ජීවන තත්වයන් භුක්ති විඳීමට ඇති අයිතිය
12 වැනි වගන්තිය - ළඟා කර ගත හැකි ඉහළම මට්ටමේ ශාරීරික හා මානසික සෞඛ්‍යයක් ලබා ගැනීමේ අයිතිය.
13 වැනි වගන්තිය - අධ්‍යාපනය ලැබීමේ අයිතිය.



**යමෙකු මගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළොත් සිදු කළ හැක්කේ කුමක්ද?**





ඔබට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකියි (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාව).

නමුත් මතක තබා ගන්න:

- ★ එය උල්ලංඝනය සිදු වී දින 30ක් ඇතුළත ගොනු කළ යුතුය.

  පැමිණිලිකරුවෙකු ප්‍රථමයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට (HRCSL) පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම්, මාසයක කාලය ගණනය කිරීමේදී, මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂණය විභාග වෙමින් පවතින කාලය ගණනය නොකෙරේ - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 13 වැනි වගන්තිය.

- ★ එය විධායක හෝ පරිපාලන ක්‍රියාවන්ට එරෙහිව පමණක් විය යුතුය.

**මානව හිමිකම් ගැටලු ගැන පැමිණිලි කරන්න තැනක් තියෙනවද?**





ඔව්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) මූලික අයිතිවාසිකම් ලෙස සෘජුවම ආවරණය නොවන ගැටලු ඇතුළු මානව හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කරනවා. ඔබට ක්‍රම කිහිපයකින් පැමිණිලි කරන්න පුළුවන්:

1. පෞද්ගලිකව පැමිණ - HRCSL ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට වාචික පැමිණිල්ලක් ලබා දීම.
2. ලිඛිතව - තැපෑලෙන් හෝ ඕනෑම HRCSL කාර්යාලයකට ගෙනවිත් බාර දීමෙන්.
3. අන්තර්ජාලය හරහා - විද්‍යුත් තැපෑලෙන් (Email) පැමිණිල්ලක් සිදු කිරීම.

හදිසි අවස්ථාවක් නම් (උදා - නීති විරෝධී ලෙස රඳවා තබා ගැනීම), පෞද්ගලිකව පැමිණීම හෝ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික ඇමතුම් අංකය ඇමතීම වඩාත් සුදුසුය.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ නීතිය



▌ සදුනි - විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක්

▌ අනූෂා - නීති උපදේශිකාවක්



අනූෂා මේ දවස් වල සමාජ මාධ්‍ය වල ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගැන දේවල් කතා වෙනවා සහ එය ඉතා සාමාන්‍ය දෙයක් බවට පත් වෙලා තියෙනවා. මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?



**ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය (පවුල් ප්‍රචණ්ඩත්වය)**

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යනු පවුලක් තුල වින්දිතයා සහ ප්‍රචණ්ඩත්වය සිදු කරන්නා අතර පවතින පෞද්ගලික සබඳතාවය හේතුවෙන්, නිවස තුළ හෝ ඉන් පිටතදී වින්දිතයාට එරෙහිව සිදු කරනු ලබන ශාරීරික හෝ මානසික හානියකි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් බොහෝ විට පීඩාවට පත්වන්නේ කාන්තාවන් සහ දරුවන්ය. මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය, ආර්ථික අර්බුද, ස්ත්‍රී පුරුෂ අසමානතාවය, පවුල තුළ පවතින අධිකාරී බලය සහ සමාජීය මතයන් වැනි කරුණු හේතුවෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය බොහෝ දුරට සිදු වේ.

« පටුන වෙත



ඒ කියන්නේ ශාරීරිකව පහර දීම විතරක් නෙමෙයි නේද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය කියන්නේ?



හොද ප්‍රශ්නයක්. නැහැ ඊට වඩා පුළුල් පරාසයක මෙය පැතිරෙනවා. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ප්‍රධාන වශයෙන් ආකාර 04 කට වර්ග කරන්න පුළුවන්

**01.ශාරීරික ප්‍රචණ්ඩත්වය**
පුද්ගලයෙකුගේ ශරීරයට තුවාල සිදු කිරීම, පහර දීම. තල්ලු කිරීම, අතින් පයින් පහර දීම හෝ ඇනීම වැනි ක්‍රියා මෙයට ඇතුළත් වේ.

**02.මානසික ප්‍රචණ්ඩත්වය**
බිය වැද්දීම, තැතිගැන්මට ලක්කිරීම, විවේචනය කිරීම, තර්ජනය කිරීම සහ මානසික පීඩනය ඇති කිරීම වැනි ක්‍රියා මෙයට ඇතුළත් වේ.

**03.ආර්ථික ප්‍රචණ්ඩත්වය**
අවශ්‍යතා සඳහා මුදල් ලබා නොදීම, අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයීම ප්‍රතික්ෂේප කිරීම සහ දේපළ පාලනය කිරීම වැනි ක්‍රියා මෙයට ඇතුලත් වේ.

**04. ලිංගික ප්‍රචණ්ඩත්වය**
කැමැත්තකින් තොරව සිදු කරන ලිංගික ක්‍රියාකාරකම්, ලිංගික බලහත්කාරකම් සහ ලිංගික සූරාකෑම් වැනි ක්‍රියා මෙයට ඇතුලත් වේ



අපේ රටේ නීතියෙන් මේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගැන හඳුන්වන්නේ කොහොමද අක්කේ?



2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනතේ 23 වන වගන්තිය මගින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ප්‍රධාන කොටස් දෙකකට වර්ග කරනවා

**01.ශාරීරික හිංසනය**

- දණ්ඩ නීති සංග්‍රහයේ 16 වන පරිච්ඡේදය යටතට ගැනෙන වැරදි- උදාහරණ- මිනීමැරීම, ස්ත්‍රී දූෂණය, බරපතල තුවාල සිදු කිරීම සහ ලිංගික අපයෝජනය.
- බිය ගැන්වීම : (දණ්ඩ නීති සංග්‍රහයේ 372 වගන්තිය)
- අපරාධමය බිය ගැන්වීම (දණ්ඩ නීති සංග්‍රහයේ 483 වගන්තිය)
- ඉහත සඳහන් වැරදි සිදු කිරීමට උත්සාහ කිරීම.

**02. මානසික හිංසනයන්**

- උදාහරණ - සිත රිදවන ආකාරයෙන් වචන භාවිතා කිරීම.
- අනෙක් අයගේ හැඟීම්වලට ගරු නොකරමින් මානසික පීඩනය ඇති කිරීම.



**යම්කිසි කෙනෙක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයකට මුහුණ දීල තිබ්බොත් ඔහු හෝ ඇය මුලින්ම සහ පසුව මොනවද කරන්න ඕනෙ අක්කේ?**



ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයක් සිදු වූ විට
කළ යුතු දේවල්

- ප්‍රචණ්ඩත්වය සිදු වූ ස්ථානයෙන් වහාම ඉවත් වී ආරක්ෂිත ස්ථානයකට යෑම.
- වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම

ප්‍රචණ්ඩත්වය හේතුවෙන් තුවාල සිදුවුවහොත්, වහාම අසල ඇති රජයේ රෝහලකට ගොස් ප්‍රතිකාර ලබා ගත යුතුය. අදාළ වෛද්‍ය වාර්තාව පීඩාවට පත් පුද්ගලයා විසින් අනාගතයේ දී ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග සදහා මනා රුකුලක් වනු ඇත.

- පොලිස් ස්ථානයේ පැමිණිලි කිරීම

පීඩාවට පත් පුද්ගලයා තමන්ට සිදු වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව, එම ප්‍රචණ්ඩත්වය සිදු වූ බලප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ලක් කළ යුතු අතර එම පැමිණිල්ලේ පිටපතක් තමන් සන්තකයේ තබා ගත යුතුය. මෙය පීඩාවට පත් පුද්ගලයා විසින් අනාගතයේ දී ගනු ලබන නීතිමය ක්‍රියා මාර්ග සඳහා රුකුලක් වන අතර, එම පුද්ගලයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ද උපකාරී වේ. පීඩාවට පත් කාන්තාවන් සහ දරුවන්ට පොලිස් ස්ථානවල ඇති කාන්තා සහ ළමා කාර්යංශය (Women and Children's Bureau) සම්බන්ධ කර ගත හැකිය.



**අපි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නඩුවක් පවරනව නම් එහි කාර්ය පටිපාටිය මොකක්ද? ඒවගේම නඩුව ගොනු කරන්න හැකියාව ඇත්තේ කාටද?**



මම ඒ ගැන පැහැදිලි කරන්නම්

**ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබද නඩු පවරා පවත්වාගෙන යාමේ ක්‍රියා පටිපාටිය**

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කළ යුතුය.

**ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩුවක් ගොනු කළ හැක්කේ පහත අයටයි**

01. පීඩාවට පත් පුද්ගලයා විසින්ම.
02. පීඩාවට පත් පුද්ගලයා වෙනුවෙන් පොලිසිය විසින්.
03. පීඩාවට පත් පුද්ගලයා දරුවකු නම්

i. එම දරුවාගේ දෙමාපියන් හෝ  භාරකරුවන් විසින්.
ii. එම දරුවා දැනට වාසය කරන්නේ යම් පුද්ගලයෙකු සමගද, එම පුද්ගලයා විසින්
iii. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් බලය පවරන ලද පුද්ගලයෙකු විසින්.



**ඒ වගේම මේ වගේ නඩු පවරන්න පුළුවන් කාට එරෙහිවද කියලත් පැහැදිලි කරනවද?**



මෙහිදී පාර්ශවයන් කිහිපයකට එරෙහිව නඩු ගොනු කල හැකියි. ඒ අය පහත පරිදි වේ.

පීඩාවට පත් පුද්ගලයාගේ,

1. විවාහක සහකරු හෝ සහකාරියට විරුද්ධව
2. කලින් විවාහයේ සහකරු හෝ සහකාරියට විරුද්ධව
3. විවාහයකින් පරිබාහිරව එකට ජිවත්වන සහකරු හෝ සහකාරියට විරුද්ධව
4. පීඩාවට පත් පුද්ගලයාගේ විවාහක සහකරු හෝ සහකාරියගේ/කලින් විවාහයේ සහකරු හෝ සහකාරියගේ/එකට ජීවත්වන සහකරු හෝ සහකාරියගේ,
   I. දෙමාපියන්, මුණුබුරන්, මිණිබිරියන්
   II. දරුවන්, දරුමුණුබුරන්
   III. සහෝදර සහෝදරියන්
   IV. තමන් නොවැදු දරුවන්



**ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාළ නඩුවකදී අපිට අධිකරණයෙන් මොන වගේ සහනද ලබා ගන්න පුළුවන්?**



සහන ලබා ගන්න පුළුවන් ආකාර කිහිපයක් තියෙනවා

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත යටතේ ලබා ගත හැකි සහන

**1. අතුරු ආරක්ෂණ නියෝගය**

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් පාර්ශවයට විභාගයකින් තොරව කඩිනම් සහ ක්ෂණික ආරක්ෂාවක් ලබා ගැනීම සඳහා පවතින නීතිමය විධිවිධානය අතුරු නියෝගය ලෙස හැඳින්වේ. මෙය අධිකරණය මගින් ආරක්ෂණ නියෝගයක් නිකුත් කරන තෙක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ලබා දෙන තාවකාලික නියෝගයකි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් පුද්ගලයා මහේස්ත්‍රාත් අධිකරණයට පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ විට, එම අයදුම්පත පිළිබඳව අධිකරණය සෑහීමට පත්වුවහොත් සහ අදාළ පුද්ගලයා තවදුරටත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමේ අවදානමක් ඇති බවට අධිකරණයට වැටහී ගියහොත් අතුරු නියෝගයක් නිකුත් කළ හැකිය. මෙම විධිවිධාන මගින් අධිකරණ ක්‍රියා මාර්ග සහ විභාගවලදී

« පටුන වෙත

සිදුවන කාලය ගතවීම් මහහරවා ගනිමින්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූවකු අධිකරණයේ පිහිට පතන අවස්ථාවේදීම ඔහුට හෝ ඇයට ආරක්ෂණ නියෝගයක් ලබා ගැනීමට මග පෑදේ. පීඩාවට පත් පුද්ගලයා විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත පදනම් කරගෙන විභාගයක් පැවැත්වීම සඳහා එම අයදුම්පත ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත සුදුසු දිනයක් නියම කළ යුතුය. මෙම අතුරු ආරක්ෂණ නියෝගය, අධිකරණය විසින් ස්ථිර ආරක්ෂණ නියෝගයක් නිකුත් කරන තෙක් හෝ අධිකරණය විසින් අදාළ අතුරු ආරක්ෂණ නියෝගය අවලංගු කරන තෙක් බලපැවැත්වේ.

## 2. ආරක්ෂණ නියෝගය

**ආරක්ෂණ නියෝගය ප්‍රධාන ක්‍රම 3 ක් යටතේ ලබා දිය හැකිය.**

1. වරද පිළිගැනීමක් හෝ එය ඔප්පු කිරීමක් අවශ්‍ය නොවන පරිදි, දෙපාර්ශවයම එකඟ වන්නේ නම් අධිකරණයට ආරක්ෂණ ආඥාවක් නිකුත් කළ හැකිය.

2. ප්‍රචණ්ඩත්වය සිදුකළ පුද්ගලයාට අධිකරණයට පැමිණෙන ලෙස දන්වා නිසි පරිදි සිතාසි ලැබී ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් ඔහු නොමැති වුවද පීඩාවට පත් පුද්ගලයාගේ දිවුරුම් ප්‍රකාශ හෝ වාචික ප්‍රශ්න පදනම් කර ගනිමින් ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ හැකිය.

3. පීඩාවට පත් පුද්ගලයා සහ ප්‍රචණ්ඩත්වය සිදුකළ පුද්ගලයා යන දෙදෙනාම අධිකරණයේ පෙනී සිටින්නේ නම්, දෙපාර්ශවයම විභාග කර, සාක්ෂි සහ ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු ප්‍රචණ්ඩත්වයක් සිදුවී ඇති බවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ හැකිය.

මෙලෙස නිකුත් කරනු ලබන ආරක්ෂණ නියෝගයක් වසර 10ක කාලයක් සඳහා බලපැවැත් වේ.

**ආරක්ෂණ නියෝගයක් මගින් පනවන කොන්දේසි යටතේ ප්‍රචණ්ඩත්වය සිදුකළ පුද්ගලයාට පහත සදහන් ක්‍රියාවන් සිදුකිරීම තහනම් කරනු ලැබේ.**

1. පීඩාවට පත් පුද්ගලයාගේ නිවසට හෝ නිවසේ කොටසකට, රැකියා ස්ථානයට, පාසලට හෝ ඔහු / ඇය තාවකාලිකව නැවතී සිටින ස්ථානයට ඇතුලු වීම

2. පීඩාවට පත් පුද්ගලයාගේ දරුවන් බැලීමට යෑම හෝ ඔවුන් හමුවීම

3. පීඩාවට පත් පුද්ගලයා සම්බන්ධ කර ගැනීම හෝ සම්බන්ධ කර ගැනීමට උත්සාහ කිරීම

4. පීඩාවට පත් පුද්ගලයාගේ මිතුරන්ට, ඥාතීන්ට හෝ සේවා ස්ථානයේ සගයන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම

5. විවාහක නිවස විකිණීම හෝ වෙනත් අයෙකුට පැවරීම

6. පීඩාවට පත් පුද්ගලයාට කරදරයක් හෝ හිරිහැරයක් සිදු කිරීම

**අනුබද්ධ නියෝග**

අධිකරණය විසින් පීඩාවට පත් පාර්ශවය වෙනුවෙන් ස්ථිර ආඥාවක් නිකුත් කිරීමෙන් පසු, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනතේ 12 වන වගන්තිය යටතේ පීඩාවට පත් පුද්ගලයාගේ ක්ෂණික ආරක්ෂාව සහ යහපැවැත්ම සලකා බලා පහත සඳහන් අනුබද්ධ නියෝග නිකුත් කළ හැකිය.

1. වගඋත්තරකාර (චූදිත) පාර්ශවය සන්තකයේ ඇති ආයුධ පොලිසියේ භාරයට ගැනීමට නියෝග

2. පීඩාවට පත් පුද්ගලයාගේ සහ ඔහුගේ / ඇයගේ දරුවන්ගේ පෞද්ගලික බඩු බාහිරාදිය ලබා ගැනීමට පොලිස් සහාය ලබා දීම

3. අදාළ පාර්ශවය අනිවාර්ය මනෝවිද්‍යාත්මක උපදේශනයට හෝ පුනරුත්ථාපන ප්‍රතිකාර සඳහා යොමු කිරීම

4. පීඩාවට පත් පාර්ශවය සඳහා තාවකාලික නවාතැන් පහසුකම් සලසා දීම

5. ආරක්ෂක නියෝගය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි නිරීක්ෂණය කිරීම සඳහා පවුල් සුභසාධන නිලධාරියෙකු හෝ ළමා පරිවාස නිලධාරියෙකු පත් කිරීම

6. පීඩාවට පත් පුද්ගලයා වෙනුවෙන් හදිසි මූල්‍ය ආධාර සපයන ලෙස වගඋත්තර පාර්ශවයට නියෝග කිරීම

7. පීඩාවට පත් පුද්ගලයාට නිවසේ ජීවත් වීමට අවශ්‍ය පහසුකම් සහ වියදම් ලබා දෙන ලෙස වගඋත්තරකාර පාර්ශවයට නියෝග කිරීම

**ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව නඩුවකදී අධිකරණය විසින් ලබාදුන් අතුරු ආරක්ෂණ නියෝගයක් හෝ ආරක්ෂණ නියෝගයක් උල්ලංඝනය කළහොත් පනවනු ලබන දඬුවම්**

- රු.10,000 දක්වා දඩයක් නියම කළ හැකිය. හෝ
- එක් අවුරුද්ද (01) කාලයක් බන්ධනාගාරගත කළ හැකිය. හෝ
- ඉහත දඩය සහ සිරදඬුවම් යන දෙකම නියම කළ හැකිය.



ආරක්ෂිත නිවාස කියන්නේ මොනවද අක්කේ, ඒවා තියෙන ස්ථාන මොනවද, ඒවගේම ඒවයින් මෙවැනි වින්දිතයන්ට සැලසෙන සහන මොනවද?

**ආරක්ෂිත නිවාස (safe homes)**

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ලිංගික අපරාධ, තර්ජන හෝ දැඩි අවදානමකට ලක්ව සිටින කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් තාවකාලිකව ආරක්ෂිතව නවාතැන් ගැන්වීම සඳහා ඇති රහසිගත ස්ථාන ආරක්ෂිත නිවාස ලෙස හැඳින්වේ. ආරක්ෂක හේතූන් මත මෙම ආරක්ෂිත නිවාස පිහිටි ලිපිනයන් පොදුවේ ප්‍රසිද්ධ කරනු නොලැබේ. උතුරු පළාතේ දැනට ක්‍රියාත්මක වන්නේ මෙවැනි එක් ආරක්ෂිත නිවාසයක් පමණි.

උතුරු පළාතේ ක්‍රියාත්මක වන මෙම ආරක්ෂිත නිවාසය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය ඒකාබද්ධව පවත්වාගෙන යනු ලබයි. ඒ වගේම අනෙකුත් දිස්ත්‍රික්ක වලත් මේ වගේ ආරක්ෂිත නිවාස තියෙනවා

**ආරක්ෂිත නිවාස වෙත ප්‍රවේශ විය හැකි ක්‍රම**

- අධිකරණ නියෝගයක් මගින්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම්වරයාගේ හෝ කාන්තා සංවර්ධන නිලධාරිනියගේ ඉල්ලීම පරිදි
- සහාය පතන කාන්තා සංවිධානවල ඉල්ලීම පරිදි
- පොලිසියේ පැමිණිල්ලකට අනුව පොලිසිය මගින්
- රජයේ රෝහල් මගින්

**ආරක්ෂිත නිවාස මගින් ඉටුකරනු ලබන සේවාවන්**

- පීඩාවට පත්වූවන්ට වහාම ආරක්ෂාව සලසා දීම
- සෞඛ්‍යමය, සමාජීය සහ නීතිමය සහය ලබා ගැනීමට උපකාර කිරීම
- පීඩාවට පත් වූවන් සඳහා ආහාර, ඇඳුම් පැළඳුම් සහ නවාතැන් පහසුකම් ලබා දීම
- අධිකරණයට සහ රෝහල් වෙත යාම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබාදීම



ආරක්ෂිත ස්ථානයක රැඳී සිටිය හැකි උපරිම කාලය මාස 06 කි. කෙසේ වෙතත්, අධිකරණ නියෝගය මත හෝ නඩු සමාලෝචන සාකච්ඡා මගින් ගනු ලබන තීරණ අනුව එම කාල සීමාව දීර්ඝ කළ හැකිය.

**උතුරු පළාතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන්ට සහාය දක්වන ආයතන**

**රාජ්‍ය ආයතන**
නීති ආධාර කොමිෂන් සභාව, පොලිස් නිලධාරීන්, අධිකරණ වෛද්‍ය නිලධාරි (JMO), රජයේ මනෝවිද්‍යාත්මක උපදේශකයින්, පරිවාස සහ ළමාරක්ෂක නිලධාරීන්

**රාජ්‍ය නොවන සංවිධාන**
සහාය පතන කාන්තා සංවිධානය (WIN), යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය

**මනෝවිද්‍යාත්මක සහ මනෝ - සමාජීය සහාය ලබාගත හැකි ක්‍රම**

**සෞඛ්‍ය**
රෝහල් - වෛද්‍යවරුන්, මනෝවිද්‍යාත්මක උපදේශකයින්, පුනරුත්ථාපන මධ්‍යස්ථානය, මිතුරු පියස

**සමාජය**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ළමා හා කාන්තා අංශය, (WDO, මනෝවිද්‍යාත්මක උපදේශකයින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරීය (NCPA), ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී (CRPO) , රාජ්‍ය නොවන සංවිධාන (NGOs) , උදාහරණ - සහාය පතන කාන්තා සංවිධානය, යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය

**නීතිය**
නීති ආධාර කොමිෂන් සභාව, පොලිස් නිලධාරීන්, සමථ මණ්ඩල, සහාය පතන කාන්තා සංවිධානය



මේ දේවල් ගැන කතා කිරීමත් විශාල ශක්තියක් වගේ. මේ දේවල් ගැන ජනතාව දැනුවත් වෙන එක ගොඩක් වැදගත් නේද අක්කේ?

ඔව් අනිවාර්යෙන්ම. නිහඬව ඉන්න එක කිසිසේත්ම විසඳුමක් නෙමෙයි. කතා කිරීමත් උදව් ඉල්ලීමත් තමයි පළමු පියවර.



# රජයේ ඉඩම් හා බැඳුණු ඔබේ අයිතිවාසිකම්

## පුරවැසි මාර්ගෝපදේශයන්



**රජයේ ඉඩම් කියන්නේ මොනවාද? ඒවා සැබවින්ම හිමි කාටද?**



ශ්‍රී ලංකාවේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් රජය සතුය. රජයේ ඉඩම් පිළිබඳ නීතියට අනුව සියලු ම මුඩු ඉඩම්, කැලෑ ඉඩම්, පදිංචි වී නොමැති හෝ වගා නොකළ ඉඩම්වල අයිතිය, එයට පටහැනි භාවයක් ඔප්පු කරන තෙක් රජයට හිමි බවට පූර්ව උපකල්පනය කෙරේ (රජයේ ඉඩම්වලට අනවසරයෙන් පිවිසීම පිළිබඳ ආඥාපනතේ 7 වන වගන්තිය). ලංකාවේ පවතින නීතියට අනුව, රජයේ ඉඩම්වල පරම අයිතිය හිමිවන්නේ **ශ්‍රී ලංකා රජයටයි.** රජය විසින් මෙම ඉඩම් පාලනය කරනු ලබන්නේ **මහජනතාව වෙනුවෙනි.** තාක්ෂණික වශයෙන්, රජයේ ඉඩම් අන්සතු කිරීමේ හෝ පැවරීමේ අවසාන බලය පවතින්නේ **ජනාධිපතිවරයා** සතුවය (13 වන සංශෝධනයේ 2 වන පරිශිෂ්ඨය). ප්‍රායෝගිකව, මෙම කටයුතු ඉඩම් කොමසාරිස්වරයා හරහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට (දිසාපති) සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරා ඇත.



« පටුන වෙත



කෙනෙක් රජයේ ඉඩමක කාලයක් පදිංචි වී සිටියොත් ඒ ඉඩමේ අයිතිය ලබා ගන්න පුලුවන්ද? (කාලාවරෝධී අයිතිය)



එහෙම ලබා ගන්න ගන්න බැහැ.

රජයේ ඉඩම් සම්බන්ධයෙන් කාලාවරෝධී අයිතිය (Prescriptive Title) ප්‍රකාශ කළ නොහැකියි. පුද්ගලික ඉඩමක වසර 10ක් අඛණ්ඩව සහ බාධාවකින් තොරව පදිංචි වී සිටීමෙන් අයිතිය ඉල්ලා සිටිය හැකි වුවද, රජයේ ඉඩම් සඳහා එය අදාළ නොවේ (රජයේ ඉඩම් ආඥාපනතේ 103 වගන්තිය සහ කාලාවරෝධී ආඥාපනතේ 15 වන වගන්තිය). ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බලපත්‍රයක් හිමි අයෙකුට වුවද, එම ඉඩම සඳහා කාලාවරෝධී අයිතිය ලබා ගත නොහැක (161 වගන්තිය). එසේම රජයේ රක්ෂිතයක අනවසරයෙන් පදිංචි වී සිදුකරන වැඩිදියුණු කිරීම් සඳහා වන්දි පවා ඉල්ලා සිටිය නොහැක (රජයේ ඉඩම් ආඥාපනතේ 52 සහ 53 වගන්ති).



පළාත් සභාවලට රජයේ ඉඩම් අන්සතු කරන්න පුලුවන්ද?



ශ්‍රේෂ්ඨාධිකරණයට අනුව, රජය මෙම ඉඩම් පාලනය කරනු ලබන්නේ මහජනතාව වෙනුවෙන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ ඉඩම් බලතල පළාත් සභාවලට බෙදා දී තිබුණද, රජයේ ඉඩම් අන්සතු කිරීමේ හෝ පැවරීමේ අවසාන බලය පවතින්නේ ජනාධිපතිවරයා සතුවය (13 වන සංශෝධනය).



රජයේ ඉඩම් බෙදා දීම පාලනය වන ප්‍රධාන නීති මොනවාද?



ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් පුරවැසියන් අතර බෙදා දීම සහ පාලනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් නීති හතරක් භාවිතා වෙනවා:

I **ඉඩම් සංවර්ධන ආඥාපනත (Land Development Ordinance No. 15 of 1935) (464 වැනි පරිච්ඡේදය)**[1]: මෙය රජයේ ඉඩම් ක්‍රමවත්ව සංවර්ධනය කර බෙදා දීම සඳහා වන ප්‍රධාන නීතියයි

II **රජයේ ඉඩම් ආඥාපනත (State Lands Ordinance No. 8 of 1947) (454 වැනි පරිච්ඡේදය)**[2]: ඉඩම් ප්‍රදානය, බදු දීම සහ බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන පොදු නීතිමය රාමුව සපයයි.

---

[1](Ordinance No. 03 of 1946, Law Nos, 43 of 1973, Act Nos, 49 of 1953, 22 of 1955, 16 of 1969, 21 of 1971, 27 of 1981, 10 of 1983, 22 of 1993, 9 of 1995, 20 of 1996 and 11 of 2022 යන නීතිය යටතේ සංශෝධනය වී ඇත)

[2](Ordinance No.9 of 1947, Act Nos, 13 of 1949, 40 of 1978 and10 of 1983 යන නීතිය යටතේ සංශෝධනය වී ඇත)

III. **ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (Land Grants (Special Provisions) Act No. 43 of 1979)**
ඉඩම් නොමැති අයට සෘජුවම ඉඩම් ප්‍රදානය කිරීම සඳහා මෙම නීතිය ප්‍රතිපාදන සලසා ඇත.

IV. **ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය (Land Reform Law No. 1 of 1972)**[3] මෙම නීතිය යටතේ රජයට පවරා ගත් (Vested) ඉඩම් බෙදා දීම සිදු කෙරේ.



**රජයේ ඉඩමක් ලබා ගැනීමට අවශ්‍ය පොදු සහ විශේෂ සුදුසුකම් මොනවාද?**



සෑම නීතියක් යටතේම ඉඩම් ලබා ගැනීමට නම් මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම අත්‍යවශ්‍ය වේ. ඉන්පසු පහත එක් එක් නීතිය යටතේ පහත සුදුසුකම් සලකා බලනු ලැබේ:

**ඉඩම් සංවර්ධන ආඥාපනත (Land Development Ordinance - LDO)**

මෙම ආඥාපනත යටතේ ඉඩම් ලබා දීම සඳහා වන සුදුසුකම් 1981 අංක 27 දරන පනතින් සංශෝධිත නියෝගවල සවිස්තරාත්මකව දක්වා ඇත:

- පුරවැසිභාවය: අයදුම්කරු අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තේරීම් ක්‍රමය: ඉඩම් ලබා දීම සඳහා පවත්වනු ලබන "ඉඩම් කච්චේරියකට" පෙනී සිට එතැනින් සුදුස්සෙකු ලෙස තේරී පත්වීම අත්‍යවශ්‍ය වේ.
- ප්‍රමුඛතා වර්ගීකරණය (1981 නියෝග 3):
  - ගොවියන් (Peasants): ඉඩම වගා කිරීමට කැමැත්තක් හා හැකියාවක් ඇති, තමාගේ සහ තම පවුලේ ජීවනෝපාය සඳහා ඉඩමෙන් ලැබෙන ආදායම මත යැපෙන පුද්ගලයන්.
  - උගත් තරුණයන් (Educated Youth): වයස අවුරුදු 18 ට නොඅඩු සහ 25 ට වැඩි නොවන, වගා කටයුතු පිළිබඳ උනන්දුවක් හා හැකියාවක් ඇති, අවම වශයෙන් 8 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති රැකියා විරහිත තරුණ පිරිස්.
  - අඩු ආදායම්ලාභීන්: වාර්ෂික ආදායම රුපියල් 15,000 නොඉක්මවන පුද්ගලයන්.
  - වැඩි ආදායම්ලාභීන්: වාර්ෂික ආදායම රුපියල් 15,000 ත් 25,000 ත් (තනිකඩ නම්) හෝ රුපියල් 15,000 ත් 45,000 ත් (විවාහක නම්) අතර වන පුද්ගලයන්.

[3](39 of 1975,14 of 1981, 39 of 1981, 12 of 1983,14 of 1986,18 of 1986 යන නීතිය යටතේ සංශෝධනය වී ඇත)

### රජයේ ඉඩම් ආඥාපනත (State Lands Ordinance - SLO)

මෙම ආඥාපනත යටතේ ඉඩම් ලබා දීම වඩාත් පොදු ස්වභාවයක් ගන්නා අතර රජයේ විශේෂ අභිමතය පරිදි සිදු වේ:

- අභිමතය: ඉඩම් ප්‍රදානය කිරීමට, බදු දීමට හෝ අවසර පත්‍ර නිකුත් කිරීමට පරම බලය ජනාධිපතිවරයා (හෝ ඔහු වෙනුවෙන් අමාත්‍යවරයා) සතු වේ.
- විශේෂ පරමාර්ථ: අධ්‍යාපනික, ආගමික, පුණ්‍ය කටයුතු හෝ මහජන යහපත උදෙසා වූ විශේෂ කටයුතු සඳහා ඉඩම් ලබා ගැනීමට පුද්ගලයන්ට හෝ ආයතනවලට සුදුසුකම් ඇත.
- ආයතනික අවශ්‍යතා: රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය ඉඩම් ද මෙම පනත යටතේ වෙන් කරනු ලැබේ.

### ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (Land Grants (Special Provisions) Act)

මෙම පනතේ මූලික අවධානය යොමුවන්නේ ඉඩම් නොමැති දුප්පත් ජනතාව වෙතය:

- ඉඩම් නොමැති අයෙකු වීම (Landless): තමාට හෝ තම පවුලේ සාමාජිකයෙකුට පදිංචියට හෝ වගා කිරීමට ප්‍රමාණවත් ඉඩමක් නොමැති වීම ප්‍රධාන සුදුසුකමකි.

### ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය (Land Reform Law)

මෙම නීතිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගත් (Vested) ඉඩම් බෙදා දීම සිදු කෙරේ

- ඉලක්කගත කණ්ඩායම්: ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ පවරා ගත් ඉඩම්, ඉඩම් නොමැති ගොවීන් සහ කම්කරුවන් (පවරා ගත් ඉඩම්වල සේවය කළ වතු කම්කරුවන් හෝ ප්‍රදේශයේ ඉඩම් නොමැති ගොවීන් වීම (18(ආ)(i) වගන්තිය) අතර බෙදා දීම සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.
- පරිවර්තන සුදුසුකම්: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් සඳහා අවසර පත්‍රයක් හෝ ප්‍රදානයක් දරා සිටින පුද්ගලයෙකු, සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍රලාභියෙකු හෝ ප්‍රදානලාභියෙකු ලෙස නීත්‍යානුකූලව පිළිගනු ලැබේ.
- රජයේ හෝ රාජ්‍ය සංස්ථාවල සේවකයින්ට ඉඩම් ලබාගත හැක්කේ නිවාස ඉදිකිරීමේ අරමුණ සඳහා පමණි (නීතියේ 23(ආ) වගන්තිය).)

**ඉහත කී නීති හතරට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත** (1979 අංක 23), **ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත** (1979 අංක 17) හා **නාගරික සංවර්ධන අධිකාරිය පනත** (1978 අංක 41) නීති මගින් ද රජයේ ඉඩම් බෙදා දීම සිදු කෙරේ.

### "ඉඩම් කච්චේරිය" කියන්නේ මොකක්ද?

ඉඩම් කච්චේරියක් කියන්නේ රජයේ ඉඩම් පුරවැසියන් අතර බෙදා දීමේදී (අන්සතු කිරීමේදී), එම ඉඩම් ලබා දීම සඳහා **සුදුසු පුද්ගලයන් තෝරා ගැනීම** වෙනුවෙන් පවත්වනු ලබන නිල රැස්වීමක් (LDO 2 වගන්තිය). රජයේ ඉඩම් ලබා දිය යුත්තේ අත්තනෝමතික ලෙස නොව, විවෘත සහ සාධාරණ ක්‍රමවේදයකින් බව සහතික කිරීම මෙහි අරමුණයි.

### ඉඩම් කච්චේරිය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? (ප්‍රායෝගික ක්‍රියාවලිය)

1. **ප්‍රසිද්ධ දැනුම් දීම:** පවත්වන දිනය, වේලාව සහ ස්ථානය සඳහන් කරමින් පුවත්පත්, ගැසට් පත්‍ර සහ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ස්ථානවල (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ග්‍රාම නිලධාරී කාර්යාලය) දැන්වීම් පළ කරනු ලැබේ (LDO 21 වන වගන්තිය, 5 වන රෙගුලාසිය).

2. **අයදුම්පත් කැඳවීම සහ සුදුසුකම්:** ඉඩම ලබා ගැනීමට කැමති සුදුසුකම් සහිත පුරවැසියන් නියමිත පෝරමයක් මගින් අයදුම් කළ යුතුය.

3. **පුද්ගලයන් තේරීම සහ ප්‍රමුඛතාවය:** ඉඩම් කච්චේරියේදී දිසාපති හෝ ඔහු විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට ලක් කර සුදුස්සන් තෝරා ගැනීම සිදු කරයි. (84 වන නියෝගය). එහිදී පහත අයට ප්‍රමුඛතාවය ලැබේ: ගොවීන්: වගා කිරීමට හැකියාව ඇති සහ ඉඩම් නොමැති අය (3(අ) නියෝගය). උගත් තරුණයන්: වයස 18 ත් 25 ත් අතර රැකියා විරහිත තරුණ පිරිස් (3(ආ) නියෝගය). අඩු ආදායම්ලාභීන්: වාර්ෂික ආදායම රු. 15,000 ට අඩු අය (3(ඇ) නියෝගය).

4. **තීරණ ප්‍රකාශයට පත් කිරීම සහ අභියාචනා:** තේරී පත් වූ පුද්ගලයන්ගේ නාම ලේඛනයක් පසුව ප්‍රසිද්ධ කරනු ලැබේ (5(4) වන රෙගුලාසිය). ඉඩම් කච්චේරියකදී ගත් තීරණයකට යම් පුද්ගලයෙකු එකඟ නොවන්නේ නම්, එම තීරණය ප්‍රකාශයට පත් කර දින 30ක් ඇතුළත ඉඩම් කොමසාරිස්වරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය (23(3) වන වගන්තිය, 6 වන රෙගුලාසිය).

### අවසර පත්‍ර (Permits) සහ ප්‍රදාන පත්‍ර (Grants) ලබා දෙන්නේ කොහොමද?

ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙත රජයේ ඉඩම් සඳහා අවසර පත්‍ර (Permits) සහ ප්‍රදාන පත්‍ර (Grants) ලබා දෙන ආකාරය පහත පරිදි සරලව පැහැදිලි කළ හැකිය:

### ඉඩම් සංවර්ධන ආඥාපනත (Land Development Ordinance - LDO)

මෙම පනත යටතේ සාමාන්‍ය වැසියන්ට ඉඩම් ලබා දෙන්නේ පියවර දෙකකින් යුත් ක්‍රියාවලියක් හරහා ය:

- **ඉඩම් කච්චේරිය සහ පුද්ගලයන් තේරීම:** ඉඩම් ලබා දීමට පෙර, සුදුසු පුද්ගලයන් තෝරා ගැනීම සඳහා විවෘතව පවත්වනු ලබන **"ඉඩම් කච්චේරියක්"** පැවැත්විය යුතුය (20 වන වගන්තිය).
- **අවසර පත්‍රය (Permit):** තේරී පත් වූ පුද්ගලයාට ඉඩමේ පදිංචි වීමට හෝ එය සංවර්ධනය කිරීමට පළමුව අවසර පත්‍රයක් නිකුත් කෙරේ (19(1) වගන්තිය). මෙය සාමාන්‍යයෙන් "ඇ" (Form C) ආකෘති පත්‍රය මගින් සිදු වේ (7 වන නියෝගය). මෙහිදී රජයට වාර්ෂිකව නියමිත වාරික මුදලක් ගෙවිය යුතුය (19(3) වගන්තිය).
- **ප්‍රදාන පත්‍රය (Grant):** අවසර පත්‍රය යටතේ ලබා ගත් ඉඩම නිසි පරිදි සංවර්ධනය කළ පසු, පදිංචිය සඳහා නම් වසර 1ක් ද, වාරිමාර්ග සහිත වගා ඉඩමක් නම් වසර 3ක් ද ගත වූ පසු ස්ථිර ප්‍රදාන පත්‍රයක් සඳහා හිමිකම ලැබේ (19(4) වගන්තිය). මෙම ප්‍රදාන පත්‍රය "ක" (Form K) ආකෘතියට අනුව සකස් කර (32 වන නියෝගය), ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය (29 වන වගන්තිය).

### රජයේ ඉඩම් ආඥාපනත (State Lands Ordinance - SLO)

මෙම පනත යටතේ ඉඩම් ලබා දීම වඩාත් පොදු සහ විශේෂිත අවශ්‍යතා සඳහා (උදා: ආගමික හෝ මහජන යහපත) සිදු කෙරේ:

- **අන්සතු කිරීමේ බලය:** රජයේ ඕනෑම ඉඩමක් ප්‍රදානය කිරීමට, බදු දීමට (Lease) හෝ පදිංචිය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමට පරම බලය ජනාධිපතිවරයා සතු වේ (2 වන වගන්තිය).
- **විශේෂ ප්‍රදාන:** අධ්‍යාපනික, ආගමික හෝ පුණ්‍ය කටයුතු සඳහා විශේෂ කොන්දේසි මත ඉඩම් ප්‍රදානය කරනු ලැබේ (6 වන වගන්තිය). මෙවැනි විශේෂ ප්‍රදාන "අ" ආකෘතියට අනුව ලිඛිතව තිබිය යුතුය (3 වන රෙගුලාසිය).
- **ලියාපදිංචිය:** මෙම පනත යටතේ නිකුත් කරන සියලු ම ප්‍රදාන පත්‍ර හෝ බදු පත්‍ර නීත්‍යානුකූල වීමට නම් ඒවා අනිවාර්යයෙන්ම ලියාපදිංචි කළ යුතුය (26 වන වගන්තිය).

## ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත
(Land Grants (Special Provisions) Act)

මෙම පනත මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු සුදුසුකම් සහිත ඉඩම් නොමැති පුද්ගලයන්ට ස්ථිර අයිතිය ලබා දීම සඳහා විශේෂ සහන සලසයි:

- **ව්‍යවස්ථාපිත ප්‍රදාන:** ඉඩම් නොමැති අයෙකුට රජයේ ඉඩමක් ස්ථිරවම ලබා දීමේදී ජනාධිපතිවරයාගේ අත්සනින් යුතු විශේෂ ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීමට මෙම පනතේ ප්‍රතිපාදන ඇත (159අ වගන්තිය).
- **ස්ථිර කිරීමේ ක්‍රියාවලිය:** මෙහිදී ද ප්‍රදාන පත්‍ර නිකුත් කරන්නේ ඉඩම් සංවර්ධන ආඥාපනතේ දක්වා ඇති "ක" ආකෘතිය භාවිතා කරමිනි. ඉඩම සාර්ථකව පවරා දුන් පසු එම පුරවැසියාට ඉඩම සම්බන්ධයෙන් පරම අයිතිය හිමිවේ (14(2) වගන්තිය

**සාරාංශය:** සාමාන්‍ය පුරවැසියෙකුට රජයේ ඉඩමක් ලබා ගැනීමේ මූලිකම ක්‍රමය වන්නේ **ඉඩම් කච්චේරියකට** සහභාගී වී මුලින්ම **අවසර පත්‍රයක්** ලබා ගැනීමයි. පසුව එම ඉඩම සංවර්ධනය කර නියමිත වාරික ගෙවා අවසන් කළ විට, ඉහත කී ඕනෑම නීතියක් යටතේ සහනදායී ලෙස ස්ථිර **ප්‍රදාන පත්‍රයක්** (Grant) ලබා ගත හැකිය. ඕනෑම ප්‍රදාන පත්‍රයක් ලැබුණු පසු එය රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම ඔබේ අයිතිය සුරක්ෂිත වීමට අත්‍යවශ්‍ය වේ.

## ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය

ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියට අනුව "අන්සතු කිරීම" (Alienation) යන්නෙන් අදහස් කරන්නේ ඉඩමක අයිතිය විකිණීම, බදු දීම, කුලියට දීම, හුවමාරු කිරීම හෝ ප්‍රදානය කිරීමයි (**නීතියේ 66 වන වගන්තිය**). මෙහිදී "අවසර පත්‍රය" යනු යම් ඉඩමක පදිංචි වීමට හෝ වගා කිරීමට කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික බලපත්‍රයකි (**2024/03 චක්‍රලේඛයේ 4 වන නිර්වචනය**). "ප්‍රදාන පත්‍රය" හෝ විකිණීමේ ඔප්පුව (22(1) ආ) මගින් එම ඉඩමේ ස්ථිර අයිතිය පවරා දෙනු ලැබේ.

**එක් එක් නීතිය යටතේ අයිතිය ලබා දෙන ආකාරය මෙසේය:**

| පනත | අවසර පත්‍ර (Permits) | ප්‍රදාන පත්‍ර (Grants - ස්ථිර අයිතිය) |
|---|---|---|
| **ඉඩම් සංවර්ධන ආඥාපනත** | මුලින්ම පදිංචිය/වගාව සඳහා තාවකාලික අවසරයක් ලබා දේ (19 වගන්තිය). | ඉඩම සංවර්ධනය කර "ගැනුම් මිල" වාරික ගෙවා අවසන් කළ පසු ස්ථිර ප්‍රදානයක් ලැබේ (19(4)). |
| **රජයේ ඉඩම් ආඥාපනත** | තාවකාලික පදිංචිය හෝ කටයුත්තක් සඳහා අවසර පත්‍ර නිකුත් කෙරේ (2(4)). | විශේෂ අරමුණු (ආගමික/අධ්‍යාපනික) සඳහා " අ" ආකෘතියෙන් ස්ථිර ප්‍රදාන නිකුත් කෙරේ (6 වගන්තිය). |
| **ඉඩම් ප්‍රදාන පනත** | ඉඩම් නොමැති අය හඳුනාගෙන මුලින් අවසරය ලබා දේ. | සෘජුවම ජනාධිපතිවරයාගේ අත්සනින් "ක" ආකෘතියෙන් ස්ථිර අයිතිය පවරයි (159අ). |
| **ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය** | පවරා ගත් ඉඩම් මුලින් වගාවට අවසර පත්‍ර ලෙස ලබා දේ. | පසුව ඒවා ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ස්ථිර ප්‍රදාන පත්‍ර බවට පරිවර්තනය කෙරේ. |



රජයේ ඉඩම් සඳහා ලබා දී ඇති අවසර පත්‍ර (Permits) හෝ ප්‍රදාන පත්‍ර (Grants) අවලංගු කළ හැකි වන්නේ මොනයම් අවස්ථාවලදී ද?

### 1. ඉඩම් සංවර්ධන ආඥාපනත (Land Development Ordinance - LDO)

- **කොන්දේසි කඩ කිරීම:** අවසර පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් කොන්දේසියක් පිළිපැදීමට අවසර පත්‍රලාභියා අපොහොසත් වූ විට (106(1) වගන්තිය). මෙහිදී ඉඩම සංවර්ධනය නොකිරීම හෝ පදිංචි නොවීම වැනි කරුණු බලපායි.
- **ගෙවීම් පැහැර හැරීම:** රජයට ගෙවිය යුතු වාර්ෂික වාරික (Annual Installments) හෝ වෙනත් නියමිත ගෙවීම් පැහැර හැරීම (19(3) සහ 129 වගන්ති).
- **අනවසරයෙන් ඉඩම අන්සතු කිරීම:** රජයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව ඉඩම විකිණීම, බදු දීම, උකස් කිරීම හෝ වෙනත් අයෙකුට පැවරීම (46 වන වගන්තිය).
- **අනුප්‍රාප්තිකයන් නොමැති වීම:** ඉඩමේ අයිතිය ලබා ගැනීමට නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයෙකු නොමැති වීම හෝ සිටින අනුප්‍රාප්තිකයා අයිතිය ලබා ගැනීමට අකමැති වීම (104 වන වගන්තිය).
- **නොමඟ යවන සුළු තොරතුරු:** ඉඩම ලබා ගැනීමේදී සුදුසුකම් සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබීම.



### 2. රජයේ ඉඩම් ආඥාපනත (State Lands Ordinance - SLO)

- **කොන්දේසි කඩ කිරීම:** ඉඩම ප්‍රදානය කිරීමේදී හෝ බදු දීමේදී පනවන ලද විශේෂ කොන්දේසි (උදා: පස ආරක්ෂා කිරීම, ගොඩනැගිලි ඉදිකිරීමේ සීමාවන්) කඩ කිරීම (17(1) වගන්තිය).
- **බදු මුදල් පැහැර හැරීම:** නියමිත කාලය තුළ බදු මුදල් හෝ රජයේ හිඟ මුදල් ගෙවීමට අපොහොසත් වීම (86 වන වගන්තිය).
- **පෞද්ගලික අයිතිය අවසන් වීම:** අවසර පත්‍රය ලැබූ පුද්ගලයා මියගිය විට, එහි නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයෙකු නම් කර නොමැති නම් එම අයිතිය අවසන් වේ (16 වන වගන්තිය).

### 3. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය

මෙම පනත් යටතේ ලබා දුන් ඉඩම් අවලංගු කිරීමේ ක්‍රියාවලිය දැන් වැඩි වශයෙන් **ඉඩම් සංවර්ධන ආඥාපනතේ ප්‍රතිපාදන** සමඟ බැඳී පවතී:

- **පරිවර්තනය වූ නීතිමය තත්ත්වය:** ඉඩම් සංවර්ධන ආඥාපනතට අදාළ 1981 අංක 27 දරන සංශෝධනයට අනුව, මෙම විශේෂ පනත් යටතේ ලබා දුන් අවසර පත්‍ර දැන් ඉඩම් සංවර්ධන ආඥාපනතේ අවසර පත්‍ර ලෙස සලකනු ලැබේ. එබැවින් එම ආඥාපනතේ 106 වන වගන්තිය යටතේ කොන්දේසි කඩ කිරීම මත ඒවා අවලංගු කළ හැකිය.

- **ඉඩම් හිමිකම පිළිබඳ අසත්‍ය ප්‍රකාශ:** ඉඩම ලබා ගන්නා අවස්ථාවේ තමා ඉඩම් නොමැති (Landless) අයෙකු බවට අසත්‍ය ප්‍රකාශ කර තිබීම.

- **සංවර්ධන අවශ්‍යතා:** පවරා දෙන ලද ඉඩම නියමිත කාලය තුළ වගා කිරීමට හෝ සංවර්ධනය කිරීමට අපොහොසත් වීම.

වැදගත්ම කාරණාවක් තමයි මේ ඉඩම් අයිතිය සම්බන්ධයෙන් ඇති සීමාවන්. ඒවා මේ ආකාරයට පැහැදිලි කරන්න පුලුවන්

- **පුද්ගලික අයිතිය:** රජයේ ඉඩම් පනත යටතේ දෙන බලපත්‍ර පෞද්ගලික (Personal) වන අතර, අනුප්‍රාප්තිකයෙකු නම් කර නොමැති නම් අයිතිකරු මියගිය පසු අයිතිය අවසන් වේ (SLO 16 වගන්තිය).

- **කොන්දේසි කඩ කිරීම:** පස ආරක්ෂා කිරීම හෝ සංවර්ධනය පිළිබඳ පනවා ඇති කොන්දේසි කඩ කළහොත් ඉඩම නැවත රජයට පවරා ගත හැකිය (SLO  17, 18 වගන්ති).

- **අනුමැතිය:** රජයේ අවසරයකින් තොරව ඉඩම කොටස්වලට බෙදීම හෝ වෙනත් අයෙකුට පැවරීම තහනම් වේ.



**අවලංගු කිරීමේ ක්‍රියාවලිය (පොදුවේ):** ඕනෑම අවලංගු කිරීමකට පෙර, අදාළ පුද්ගලයාට ඒ පිළිබඳව දින 30ක පූර්ව දැනුම්දීමක් (Notice) ලබා දී කරුණු දැක්වීමට අවස්ථාවක් දිය යුතුය (LDO 106, 107 වගන්ති). දිසාපතිවරයාගේ තීරණයට එරෙහිව ඉඩම් කොමසාරිස්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ද පුරවැසියාට අයිතිය ඇත.

**ඔබට ඔබ සතු රජයේ ඉඩම් බලපත්‍රයක් ස්ථිර ප්‍රදාන පත්‍රයක් (Grants) දක්වා යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය නම්, ඒ පිළිබඳව ඔබේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයෙන් උපදෙස් ලබා ගත හැකිය.**

අතහැර දමා ඇති ඉඩම් රජයට පවරා ගැනීම සම්බන්ධයෙන් දැනගත යුතුම කරුණු කිහිපයක් තියෙනවා. ඒවා නම්:

1. හිමිකරු විසින් වසර 8ක් හෝ ඊට වැඩි කාලයක් අතහැර දමා ඇති බව පෙනී යන ඉඩම් නැවත රජයට පවරා ගත හැක (ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනත 1 වගන්තිය සහ 2 (1) උප වගන්තිය).

2. ඉඩම පවරා ගැනීමට පෙර, ඒ පිළිබඳ දැනුම්දීම ගැසට් පත්‍රයේ සහ පුවත්පත්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළ කළ යුතුය. එමෙන්ම එම ඉඩමේ ද නිවේදනයක් ප්‍රදර්ශනය කළ යුතුය. ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනත (2(2) වගන්තිය).

3. අදාළ නිවේදනය පළ කළ දින සිට ඔබේ අයිතිය ඉදිරිපත් කිරීමට අවම වශයෙන් මාස 12ක කාලයක් ලබා දිය යුතුය. ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනත (2(1) වගන්තිය).

4. රජය පවරා ගන්නා සෑම ඉඩමක්ම තක්සේරු කළ යුතුය (9 වගන්තිය). ඉඩම පවරා ගැනීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ වී වසර 30ක් ගතවන තුරු ඔබට ඔබේ හිමිකම තහවුරු කළ හැකි නම්, එම තක්සේරු කළ වටිනාකම භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට ඔබට නීතිමය අයිතිය ඇත. ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනත (10 වගන්තිය).

5. පවරා ගැනීමේ ක්‍රියාවලියේදී සිදුවන යම් අක්‍රමිකතාවක් හේතුවෙන් ඔබට අගතියක් වී ඇත්නම්, රජයට එරෙහිව වන්දි (Damages) ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත. ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනත (16 වගන්තිය).



යුද්ධය නිසා ඉඩම් බලපත්‍ර හෝ ලියකියවිලි නැති වී ඇති අවස්ථාවකදී ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනතේ පහත ප්‍රතිපාදන අදාල වෙනවා.

ඔබ ඔබේ නම සහ ලිපිනය සහිතව ලිඛිතව හිමිකම් පෑමක් රජයේ ඒජන්තවරයාට ඉදිරිපත් කළ යුතුය (ඉඩම් නැවත පවරා ගැනීමේ ආඥා පනත - 13 වගන්තිය). අතේ ලේඛන නොමැති වුවද, ඉඩම ඔබ සතු බව පෙන්වීමට ඇති වෙනත් සියලු ම සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔබට අවස්ථාව ලැබෙන අතර රජයේ ඒජන්තවරයා ඒවා වාර්තාගත කළ යුතුය (4 වගන්තිය).



**රජයේ ඒජන්තවරයා මගේ හිමිකම පිළිනොගනියි නම් මට තිබෙන සහනය මොකක්ද?**

ඔබේ අයිතිය පිළිබඳ සැකයක් පවතී නම්, එම ගැටලු ව විමර්ශනය සඳහා දිස්ත්‍රික් අධිකරණයට යොමු කළ යුතුය (5 වගන්තිය). එහිදී විනිසුරුවරයාට ලේඛන ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීමට සහ සාක්ෂිකරුවන් කැඳවීමට බලය ඇත (11 වගන්තිය). අධිකරණ තීන්දුව ගැන සෑහීමකට පත් නොවන්නේ නම්, මුද්දර ගාස්තු ගෙවීමකින් තොරව අභියාචනාධිකරණයට යාමට ද ඔබට අයිතියක් ඇත (5 වගන්තිය).





ඉඩම දැනටමත් රජය පවරගෙන තියෙනවනම් මට ඒ වෙනුවෙන් යමක් ලබා ගැනීමේ හැකියාව තියෙනවද?

රජය පවරා ගන්නා සෑම ඉඩමක්ම තක්සේරු කළ යුතුය (9 වගන්තිය). ඉඩම පවරා ගැනීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ වී වසර 30ක් ගතවන තුරු ඔබට ඔබේ හිමිකම තහවුරු කළ හැකි නම්, එම තක්සේරු කළ වටිනාකම භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට ඔබට නීතිමය අයිතිය ඇත (10 වගන්තිය).



රජය නිසි නීතිමය පියවර අනුගමනය නොකර මගේ ඉඩම පවරා ගත්තොත් මට ඒ සදහා කරන්න පුලුවන් මොකක්ද?



පවරා ගැනීමේ ක්‍රියාවලියේදී සිදුවන යම් අක්‍රමිකතාවක් හේතුවෙන් ඔබට අගතියක් වී ඇත්නම්, රජයට එරෙහිව වන්දි (Damages) ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත (16 වගන්තිය).

**වැදගත්: මෙම තොරතුරු මූලාශ්‍රගත ලේඛන මත පදනම් වන අතර, විශේෂිත නීතිමය ගැටලුවකදී වෘත්තීය නීති උපදෙස් ලබා ගැනීම නිර්දේශ කෙරේ.**